# දෙවන බස සිංහල

## 10 ශ්‍රේණිය



අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

සියලු ම පෙළපොත් ඉලෙක්ට්‍රොනික් මාධ්‍යයෙන් ලබා ගැනීමට
www.edupub.gov.lk වෙබ් අඩවියට පිවිසෙන්න.

පළමුවන මුද්‍රණය 2014
දෙවන මුද්‍රණය 2015
තෙවන මුද්‍රණය 2016
සිවුවන මුද්‍රණය 2017
පස්වන මුද්‍රණය 2018
සයවන මුද්‍රණය 2019
සත්වන මුද්‍රණය 2020

සියලු හිමිකම් ඇවිරිණි.

ISBN 978-955-25-0390-0

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින්
රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාවේ
මුද්‍රණය කරවා ප්‍රකාශයට පත් කරන ලදි.

Published by : Educational Publications Department
Printed by : State Printing Corporation, Panaluwa, Padukka.

# ශ්‍රී ලංකා ජාතික ගීය

ශ්‍රී ලංකා මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා
සුන්දර සිරිබරිනී, සුරැඳි අති සෝබමාන ලංකා
ධාන්‍ය ධනය නෙක මල් පලතුරු පිරි ජය භූමිය රම්‍යා
අපහට සැප සිරි සෙත සදනා ජීවනයේ මාතා
පිළිගනු මැන අප භක්ති පූජා
නමෝ නමෝ මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා
ඔබ වේ අප විද්‍යා
ඔබ ම ය අප සත්‍යා
ඔබ වේ අප ශක්ති
අප හද තුළ භක්ති
ඔබ අප ආලෝකේ
අපගේ අනුප්‍රාණේ
ඔබ අප ජීවන වේ
අප මුක්තිය ඔබ වේ
නව ජීවන දෙමිනේ නිතින අප පුබුදු කරන් මාතා
ඥාන වීර්ය වඩවමින රැගෙන යනු මැන ජය භූමි කරා
එක මවකගෙ දරු කැල බැවිනා
යමු යමු වී නොපමා
ප්‍රේම වඩා සැම භේද දුරැර ද නමෝ නමෝ මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා

අපි වෙමු එක මවකගෙ දරුවෝ
එක නිවසෙහි වෙසෙනා
එක පාටැති එක රුධිරය වේ
අප කය තුළ දුවනා

එබැවිනි අපි වෙමු සොයුරු සොයුරියෝ
එක ලෙස එහි වැඩෙනා
ජීවත් වන අප මෙම නිවසේ
සොඳින සිටිය යුතු වේ

සැමට ම මෙත් කරුණා ගුණෙනී
වෙළී සමගි දමිනී
රන් මිණි මුතු නො ව එය ම ය සැපතා
කිසි කල නොම දිරනා

ආනන්ද සමරකෝන්

# පෙරවදන

දියුණුවේ හිණිපෙත කරා ගමන් කරනා වත්මන් ලොවට, නිතැතින්ම අවැසි වනුයේ වඩාත් නව්‍ය වූ අධ්‍යාපන ක්‍රමයකි. එමඟින් නිර්මාණය කළ යුත්තේ මනුගුණදම් සපිරුණු හා කුසලතාවලින් යුක්ත දරුපරපුරකි. එකී උත්තුංග මෙහෙවරට ජව බලය සපයමින්, විශ්වීය අභියෝග සඳහා දිරියෙන් මුහුණ දිය හැකි සිසු පරපුරක් නිර්මාණය කිරීම සඳහා සහාය වීම අපගේ පරම වගකීම වන්නේ ය. ඉගෙනුම් ආධාරක සම්පාදන කාර්යය වෙනුවෙන් සක්‍රීය ලෙස මැදිහත් වෙමින් අප දෙපාර්තමේන්තුව ඒ වෙනුවෙන් දායකත්වය ලබා දෙන්නේ ජාතියේ දරුදැරියන්ගේ නැණ පහන් දල්වාලීමේ උතුම් අදිටනෙනි.

පෙළපොත විටෙක දැනුම් කෝෂ්ඨාගාරයකි. එය තවත් විටෙක අප වින්දනාත්මක ලොවකට ද කැඳවාගෙන යයි. එසේම මේ පෙළපොත් අපගේ තර්ක බුද්ධිය වඩවාලන්නේ අනේකවිධ කුසලතා පුබුදු කරවාගන්නට ද සුවිසල් එළි දහරක් වෙමිනි. විදුබිමෙන් සමුගත් දිනක වුව අපරිමිත ආදරයෙන් ස්මරණය කළ හැකි මතක, පෙළපොත් පිටු අතර දැවටී ඔබ සමඟින් අත්වැල් බැඳ එනු නොඅනුමාන ය. මේ පෙළපොත සමගම තව තවත් දැනුම් අවකාශ පිරි ඉසව් වෙත නිති පියමනිමින් පරිපූර්ණත්වය අත් කරගැනුමට ඔබ සැම නිරතුරුව ඇප කැප විය යුතු ය.

නිදහස් අධ්‍යාපනයේ මහානර්ඝ ත්‍යාගයක් සේ මේ පුස්තකය ඔබ දෝතට පිරිනැමේ. පෙළපොත් වෙනුවෙන් රජය වැය කර ඇති සුවිසල් ධනස්කන්ධයට අර්ථසම්පන්න අගයක් ලබා දිය හැක්කේ ඔබට පමණි. මෙම පාඨ්‍ය ග්‍රන්ථය මනාව පරිශීලනය කරමින් නැණ ගුණ පිරි පුරවැසියන් වී අනාගත ලොව ඒකාලෝක කරන්නට දැයේ සියලු දූ දරුවන් වෙත දිරිය සවිය ලැබේවායි හදවතින් සුබ පතමි.

පෙළපොත් සම්පාදන කාර්යය වෙනුවෙන් අප්‍රමාණ වූ සම්පත්දායකත්වයක් සැපයූ ලේඛක, සංස්කාරක හා ඇගයුම් මණ්ඩල සාමාජික පිරිවරටත් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයේ සැමටත් මාගේ හදපිරි ප්‍රණාමය පුදකරමි.

**පී. එන්. අයිලප්පෙරුම**

අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

ඉසුරුපාය

බත්තරමුල්ල

2020.06.26

## නියාමනය හා අධීක්ෂණය

| | | |
|---|---|---|
| පී. එන්. අයිලප්පෙරුම | - | අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්<br>අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව |

## මෙහෙයවීම

| | | |
|---|---|---|
| ඩබ්ලිව් .ඒ. නිර්මලා පියසීලි | - | අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් (සං.)<br>අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව |

## සම්බන්ධීකරණය

| | | |
|---|---|---|
| ටී. එම්. එස්. තෙන්නකෝන් | - | නියෝජ්‍ය කොමසාරිස්<br>අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව |
| ඩී.එම්. මල්කා මිලානි | - | සහකාර කොමසාරිස් (2020 මුද්‍රණය)<br>අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව |

## සංස්කාරක මණ්ඩලය

| | | |
|---|---|---|
| 1. මහාචාර්ය තිස්ස ජයවර්ධන | - | කොළඹ විශ්වවිද්‍යාලය |
| 2. මහාචාර්ය අනුර වික්‍රමසිංහ | - | කොළඹ විශ්වවිද්‍යාලය |
| 3. එම්. ජී. මුණසිංහ | - | කථිකාචාර්ය (දෙවන බස සිංහල)<br>ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම |
| 4. පියසීලි ජයවර්ධන | - | අධ්‍යක්ෂිකා (විශ්‍රාමික)<br>ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම |
| 5. ඩබ්. එම්. පී. වික්‍රමසිංහ | - | ගුරු අධ්‍යාපනඥ සේවය,<br>රුවන්පුර ජාතික අධ්‍යාපන පීඨය |

## ලේඛක මණ්ඩලය

| | | |
|---|---|---|
| 1. එස්. එම්. ඩී. කරල්ලියද්ද | - | ගුරු සේවය<br>කෑ/ කරගහදෙණිය මු. වි., වෑ උඩ |
| 2. එම්. එච්. ඒ. සජීවනී | - | ගුරු සේවය<br>යා/ යාපනය මධ්‍ය මහා විද්‍යාලය, යාපනය |

3. එම්. එච්. එම්. ෆාරුක් - ගුරු සේවය
මාව/ දනාගම මු. වි., මාවනැල්ල

4. එච්. එම්. අනූෂා හෙට්ටිආරච්චි - ගුරු සේවය
බ/ විවේකානන්ද දෙ. වි., බදුල්ල

5. ටී. ඒ. එච්. ප්‍රියන්ති - ගුරු උපදේශිකා
මොණරාගල කලාප අධ්‍යාපන කාර්යාලය

## භාෂා සංස්කරණය

1. මහාචාර්ය අනුර වික්‍රමසිංහ - කොළඹ විශ්වවිද්‍යාලය

2. මහාචාර්ය තිස්ස ජයවර්ධන - කොළඹ විශ්වවිද්‍යාලය

## සෝදුපත් කියවීම

මහාචාර්ය අනුර වික්‍රමසිංහ - කොළඹ විශ්වවිද්‍යාලය

## චිත්‍ර සහ පිටකවර නිර්මාණය

කේ. ඒ. සමන් කළුබෝවිල - ගුරු සේවය
බප/ග/අනුර මධ්‍ය මහා විද්‍යාලය, යක්කල

## පරිගණක අක්ෂර සංයෝජනය

ජී. ඩබ්. ශෂිකා මධුමාලි - පරිගණක අංශය
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

# ලේඛක/සංස්කාරක මණ්ඩල සටහන

පවතින භාෂා ප්‍රතිපත්තිය අනුව තම අනන්‍යතාව ආරක්ෂා කරමින් ජාතියක් වශයෙන් භාෂා ප්‍රජාවක් ලෙස කටයුතු කිරීම සඳහා නව විෂය නිර්දේශය පදනම් කරගෙන මෙම පොත සම්පාදනය කර ඇත.

ලොව විවිධ රටවල භාවිත කෙරෙන ද්විභාෂා පරිහරණය පිළිබඳ නිරීක්ෂණයන් ද ප්‍රයෝජනයට ගෙන සියලු පාඩම් සංවිධානය කර ඇත.

නිපුණතා ප්‍රවේශයට පාදක වන සිංහල භාෂාවේ ගති ස්වභාවයන් හා හැඩරුව කෙරෙහි අවධානය යොමු කර එක් එක් පාඩම්වල අන්තර්ගත වචන, වචන මාලාවකට ගොනුකර ඒවා දමිළ භාෂාවෙන් ද ඇතුළත් කිරීම විශේෂත්වයක් ගනී.

විෂය නිර්දේශයේ නිපුණතාවලට අනුකූලව සැකසුණු පාඩම් අවසානයේ ක්‍රියාකාරකම් ප්‍රවේශයන් ද දමිළ භාෂාවෙන් දීම කාලීන භාෂාමය කාර්යයන් සඵල කරගැනීමට මහඟු පිටිවහලක් වේ.

අදහස් ප්‍රකාශනය, පුළුල් දැනුම හා අවබෝධය, තර්කානුකූල චින්තනය, වින්දනය හා මාධ්‍ය භාවිතය, භාෂා රීති හුරුව, වාක්මාලා සංවර්ධනය, ආකල්ප වර්ධනය යන අරමුණු ඉටුකර ගැනීම පදනම් කරගෙන සියලු ම පාඩම් ගොඩ නගා ඇත.

සරල, වඩාත් කෙටි, සිසුවාට රසවත් අවස්ථා, සරල අන්තර්ගත වචන, පද, වගන්ති භාවිතය සහ හැඩරුව, හෙළ බසේ හැඩරුව, කායික මානසික ස්වභාවය පෙන්වන ප්‍රකාශ ඉදිරිපත් කිරීමට චිත්‍රමය ප්‍රකාශ බහුල ව යොදා ගෙන තිබීම විශේෂ ම ලක්ෂණයකි.

සිංහල සංස්කෘතිය හා සංස්කෘතික උරුමයන්, දායාද, වටිනාකම්, අගයන් පිළිබඳ දැනුම හා අවබෝධය ඇති කර ගනිමින් අභිමානවත් ශ්‍රී ලාංකේය ජාතියක් ගොඩ නැගීම ඒකායන අරමුණ වේ.

# පටුන


| | | පිටුව |
|---|---|---|
| 01 | නෙලුම් නිවාසය | 1 |
| 02 | දින පොතේ පිටුවක් | 8 |
| 03 | වෛද්‍යවරයෙකු හමුවෙයි | 14 |
| 04 | මගෙ අම්මා | 19 |
| 05 | ෆාමසියක් සොයා යයි | 24 |
| 06 | යාළුවන් හමුවෙලා | 31 |
| 07 | අපට ක්‍රීඩා සමාජයක් | 37 |
| 08 | වලහා කී රහස | 43 |
| 09 | අලි බලන්න යමු | 49 |
| 10 | වැසි දිනයක් | 55 |
| 11 | මිතුරෙකුගෙන් ලිපියක් | 62 |
| 12 | චිත්‍ර ප්‍රදර්ශනයක් | 69 |
| 13 | සඳලිගේ වාසනාව | 76 |
| 14 | අයදුම් පතක් පුරවමු | 83 |
| 15 | අපේ භාෂා කඳවුර | 91 |
| 16 | මල්ලී අකුරු කියවන්නේ අද | 98 |






පිවිසෙන්න නිදහසේ සතුටින් දැනුම සොයා..

The National e-learning Portal for the General Education

ඊ... www.e-thaksalawa.moe.gov.lk

01

# නෙලුම් නිවාසය



අපේ පාසලේ ක්‍රීඩා උත්සවය ලබන සිකුරාදා පැවැත්වෙනවා. මෙවරත් අපි නිවාස තුනක් හදනවා. ඕලු, නෙලුම්, මානෙල් එම නිවාස තුන යි. අපේ නිවාසය නෙලුම් නිවාසය යි. අපේ අදහස ගොක්කොළවලින් අලුත් **නිර්මාණයක්** කරන්න යි.



“කමල් අපේ නිවාසයේ නම නෙලුම්.

ඒ නිසා අපි ලොකු නෙලුම් මලක් හදමු.”

ඔව් කුමාර, ගොක්කොළවලින් නෙලුම් මලක් හදමු.

“කමල් ගොක්කොළ තියෙන්නේ කොහේ ද?”

“අර අඹ ගහ ළඟ”

“දර්ශායි, ශාන්තියි **සැරසිලි කරන්න**”

“හොඳයි කුමාර”

“අන්න, අන්න . . . ලොකු සර් එනවා.”

“ඔව්, මේ **පැත්තට යි** එන්නේ.”

“ළමයි හුඟක් වැඩ නේ ද ?”

“ඔව් සර්”

“නිවාසයේ **නායකයා** කවුද?”

“නායකයා නවීන්. මේ ඉන්නෙ සර්.”

“සර් අර උඩ ඉන්නේ කමල්, එයා තමයි **උපනායකයා.**”

“සර්, අපි ගොක්කොළවලින් නෙලුම් මලක් **හදනවා.**”

“ආ . . . ඒක හොඳ අදහසක්”

"මේ සැරෙත් හොඳ ම නිවාසය හදන්නේ අපි.
තෑග්ග ගන්නෙත් අපි."

"හොඳයි, හොඳයි. එකමුතු ව වැඩ කරන්න."

**සියලු දෙනා ම වැඩට උදවු වෙන්න.**

ඔයාලට **ජයග්‍රහණය කරන්න පුළුවන්.**

**උත්සාහය අතහරින්න එපා.**

"මම ඔයාලට සුබ පතනවා."

ස්තුතියි සර්.

## ක්‍රියාකාරකම 01

**පිළිතුරු කියන්න.**

*விடை கூறுங்கள்.*



i ළමයි සූදානම් වන උත්සවය කුමක් ද?

ii නිවාසවල නම් මොනවා ද?

iii නෙළුම් නිවාසයේ නායකයා කවුද?

iv නිවාසය සැදීමට ගත්තේ මොනවා ද?

v සුබ පැතුවේ කවුද?

## ක්‍රියාකාරකම 02

**හිස්තැන් පුරවන්න. කියවන්න.**

*வெற்றிடங்களை நிரப்புங்கள். வாசியுங்கள்.*

| උදවු වෙන්න, කරන්න, ජයග්‍රහණය, එකමුතු ව, අතහරින්න |
|---|

i ගොක්කොළවලින් සැරසිලි ..........................................

ii .............................................. වැඩ කරන්න

iii සියලු දෙනා ම වැඩට ..........................................

iv ඔයාලාට පුළුවන් ........................................ කරන්න

v උත්සාහය .............................................. එපා



## ක්‍රියාකාරකම 03

**සුදුසු අකුරු තෝරන්න. ලියන්න.**

*பொருத்தமான எழுத்துக்களை தெரிவு செய்யுங்கள். எழுதுங்கள்.*


| | | |
|---|---|---|
| i | ගොක්කො..... | ළ, ල |
| ii | සැරසි..... | ලි, ළි |
| iii | .....ග | ල, ළ |
| iv | .....මයි | ළ, ල |
| v | ම.....ක් | ල, ළ |



## ක්‍රියාකාරකම 04

**පින්තූර බලන්න. උපදෙස් තෝරන්න.**

*படங்களைப் பாருங்கள். அறிவுரைகளை தெரிவு செய்யுங்கள்.*

i  ජයග්‍රහණය කරන්න

ii  එකමුතු ව වැඩ කරන්න

iii  නෙලුම් මලක් හදන්න

iv  සුබ පතන්න

v  පිට්ටනිය පිරිසිදු කරන්න

## ක්‍රියාකාරකම 05

**පන්ති කාමරයේ දී ගුරුතුමියගෙන් ඔබට ලැබුණු උපදෙස් පහක් ලියන්න.**

*வகுப்பறையில் ஆசிரியையிடமிருந்து உமக்குக் கிடைத்த ஐந்து அறிவுரைகளை எழுதுங்கள்.*

i පන්තිය පිරිසිදු කරන්න.

ii ........................................

iii ........................................

iv ........................................

v ........................................




# වචන මාලාව

| | | |
|---|---|---|
| නිර්මාණයක් | - | ஆக்கமொன்று |
| සැරසිලි කරන්න | - | அலங்கரிக்கவும் |
| පැත්තට යි | - | பக்கத்துக்கு |
| නායකයා | - | தலைவன் |
| උපනායකයා | - | உப தலைவன் |
| හදනවා | - | செய்கிறார்கள் |
| සියලු දෙනා ම | - | எல்லோரும் |
| වැඩට උදවු වෙන්න | - | வேலைக்கு உதவுங்கள் |
| ජයග්‍රහණය කරන්න | - | வெற்றிபெறுங்கள் |
| උත්සාහය අතහරින්න එපා | - | முயற்சியைக் கைவிட வேண்டாம் |



# 02 දින පොතේ පිටුවක්





අද ජනවාරි දෙවන දා.

පාසලේ **නිවාඩු** දවසක්.

තාත්තාට **ලියුමක් ලැබුණා.**

තාත්තා පොලොන්නරුවට මාරු කරලා.

අපට මහනුවරින් **යන්න** වෙනවා.



අපේ පංතියේ යාළුවන්ට මම යන බව කියනවා.

යාළුවන්ගෙන් වෙන් වෙලා යන කොට මට පාළුවක් දැනේවි.

ඒ වුණාට මට සතුටකුත් දැනෙනවා.

අලුත් පාසලකට යන්න ලැබෙන නිසා.

මම පොලොන්නරුවට හුඟාක් කැමතියි.

පොලොන්නරුව පැරණි නගරයක්.

පරාක්‍රම සමුද්‍රය ගැන, ගල්විහාරය ගැන, මම අහලා තියෙනවා.

පොත්වලින් කියවලාත් තියෙනවා.

මට එහේ දී හොඳ පාසලක් ලැබේවි.

ඒ පාසලේ දීත් හුඟාක් යාළුවෝ හමු වේවි.

මගේ නුවර යාළුවන් ගැන එයාලට කියනවා.

මම එහේ දී තවත් හොඳින් ඉගෙන ගන්නවා.

## ක්‍රියාකාරකම 01



**පාඩම කියවන්න. පිළිතුරු ලියන්න.**

*பாடத்தை வாசியுங்கள். விடை எழுதுங்கள்.*

i ලිපිය ලැබුණේ කවදා ද?

ii පාඩමේ කියවෙන පැරණි නගරයේ නම කුමක් ද?

iii මෙහි සඳහන් විහාරයේ නම ලියන්න.

iv ළමයාට සතුටක් දැනෙන්නේ ඇයි?

v පාසලේ දී හමුවන්නේ කවුරුන්ද?

## ක්‍රියාකාරකම 02

**සොයන්න. හිස්තැන් පුරවන්න.**

*தேடுங்கள். வெற்றிடங்களை நிரப்புங்கள்.*

සතුටක්, පොළොන්නරුව, මාරුවීමක්, ගල්විහාරය, අහලා



i තාත්තාට ............................ ලැබිලා.

ii මම ............................ තියෙනවා.

iii අපි ............................ බලන්න ගියා.

iv ............................ පැරණි නගරයක්.

v මට ............................ දැනෙනවා.

## ක්‍රියාකාරකම 03

**මේ වාක්‍ය ලියන බසට හරවන්න.**

*இந்த வசனங்களை எழுத்து மொழிக்கு மாற்றுங்கள்.*

**උදාහරණ : මම සතුටින් සිටිනවා - මම සතුටින් සිටිමි.**



i මම හොඳින් ඉගෙන ගන්නවා.

ii මම පොත් කියවනවා.

iii මම අලුත් ගුරුතුමිය හමුවෙනවා.

iv අපි පොලොන්නරුවට යනවා.

v අපි යාළුවන්ට කියනවා.

## ක්‍රියාකාරකම 04

**උදාහරණය බලන්න. වාක්‍ය සාදන්න.**

*உதாரணத்தைப் பாருங்கள். வசனங்களை அமையுங்கள்.*

**උදාහරණය :** **මම රචනාවක් ලියනවා.**
**මට රචනාවක් ලියන්න තියෙනවා.**

i මම ගමනක් යනවා.
මට ..................................................

ii මම පොතක් කියවනවා.
මට ..................................................

iii මම යාළුවන් හමුවෙනවා.
මට ..............................................

iv අපි පොළොන්නරුවට යනවා.
අපට ..............................................

v අපි චිත්‍රයක් අඳිනවා.
අපට ..............................................



## ක්‍රියාකාරකම 05

**අද දවසේ සිදු වූ දේවල් ගැන දින සටහනක් ලියන්න.**

*இன்றைய நாளில் நடந்தவற்றைப் பற்றி நாட்குறிப்பு ஒன்றினை எழுதுங்கள்.*

1 **මම උදේ දෙවන බස සිංහල පාඩම් කළා.**

2 ..............................................

3 ..............................................

4 ..............................................

5 ..............................................


6 ..............................................

# වචන මාලාව

| | | |
|---|---|---|
| ලියුමක් ලැබුණා | - | கடிதமொன்று கிடைத்தது |
| මාරු කරලා | - | மாற்றியுள்ளார் |
| යන්න වෙනවා | - | போக நேரிடும் |
| සතුටක් | - | மகிழ்ச்சியொன்று |
| හුඟාක් යාළුවෝ | - | நிறைய நண்பர்கள் |
| වෙන් වෙලා යන කොට | - | பிரிந்து செல்லும் போது |
| නිවාඩු දවසක් | - | விடுமுறை தினமொன்று |
| කියවලාත් තියෙනවා | - | வாசித்தும் இருக்கிறேன் |
| එයාලට කියනවා | - | அவர்களுக்கு சொல்லுவேன் |



# 03 වෛද්‍යවරයෙකු හමුවෙයි



ආ . . . සර්, එන්න, එන්න.

මොකද ළමයි අදත් දඟ වැඩ කරලා ද?

මේ ළමයාගේ ඇහේ බෝලයක් වැදිලා.

එන්න පුතා, ඇහැ බලමු.

ඔයාගේ නම මොකක් ද?

හෂාන්.

වයස?

අවුරුදු පහළොව යි.



පුතා, මෙහේ බලන්න.

මගේ අත දිහා බලන්න.

ඇහැ පොඩ්ඩක් රතු වෙලා.

ඇහැ රිදෙනවා ද?

නෑ ඩොක්ටර්.

ඇහැ හොඳට පරෙස්සම් කර ගන්න.

පොඩි කරන්න එපා.

හොඳයි, ඩොක්ටර්.

මම බෙහෙතක් දෙන්නම්.

එයින් බින්දු දෙක බැගින් දවසට දෙපාරක් දාන්න.

එහේ මෙහේ ඇවිදින්න යන්න එපා.

තව දවස් දෙකකින් ඇවිල්ලා මට පෙන්වන්න.

හොඳයි ඩොක්ටර්, බොහොම ස්තුතියි.

## ක්‍රියාකාරකම 01

**උපදෙස් කියවන්න.**

*அறிவுரைகளை வாசியுங்கள்.*



i මෙහේ බලන්න.

ii මගේ අත දිහා බලන්න.

iii ඇහැ හොඳට පරෙස්සම් කර ගන්න.

iv තව දවස් දෙකකින් ඇවිල්ලා පෙන්වන්න.

v එහේ මෙහේ ඇවිදින්න යන්න එපා.

## ක්‍රියාකාරකම 02

**සොයන්න. ලියන්න.**

தேடுங்கள். எழுதுங்கள்.



i හෂාන්ගේ ඇහැට සිදු වූයේ කුමක් ද?

ii හෂාන්ගේ වයස කීය ද?

iii "ඇහැ පොඩ්ඩක් රතු වෙලා." මෙසේ කීවේ කවුද?

iv ඇහැට බෙහෙත් දාන්න කීවේ කෙසේ ද?

v නැවත එන්න කීවේ දවස් කීයකින් ද?

## ක්‍රියාකාරකම 03

**සොයන්න. ලියන්න.**

தேடுங்கள். எழுதுங்கள்.


i මේ ළමයාගේ ඇහේ ............................. වැදිලා.

ii එන්න පුතා ............................. බලමු.

iii පොඩ්ඩක් ............................. වෙලා.

iv මම ............................. දෙන්නම්.

v ඇවිදින්න ............................. එපා.



## ක්‍රියාකාරකම 04

**උදාහරණය බලන්න. ලියන්න.**

*உதாரணத்தைப் பாருங்கள். எழுதுங்கள்.*

උදාහරණය :- ඇවිදින්න යන්න → ඇවිදින්න යන්න එපා

i දවසට දෙපාරක් දාන්න → ............................

ii ඇවිල්ලා මට පෙන්වන්න → ............................

iii ඇහැ අතගාන්න → ............................

iv ඇහැ පොඩි කරන්න → ............................

v ඇහැට දූවිලි වදින්න දෙන්න → ............................

## ක්‍රියාකාරකම 05

**ඔබට වෛද්‍යවරයෙකුගෙන් ලැබුණු උපදෙස් 4 ක් ලියන්න.**

*உமக்கு வைத்தியர் ஒருவரிடமிருந்து கிடைக்கப்பெற்ற அறிவுரைகள் நான்கை எழுதுக.*

උදාහරණය :- ඇහැ පොඩි කරන්න එපා.



i ............................................................

ii ............................................................

iii ............................................................


iv ............................................................

# වචන මාලාව



| | | |
|---|---|---|
| වැදිලා | - | பட்டுள்ளது |
| රතු වෙලා | - | சிவந்துள்ளது |
| අත දිහා බලන්න | - | கைனைப் பாருங்கள் |
| මෙහේ බලන්න | - | இங்கே பார்க்கவும் |
| පරෙස්සම් කර ගන්න | - | கவனமாக வைத்துக் கொள்ளுங்கள் |
| පොඩි කරන්න එපා | - | கசக்க வேண்டாம் |
| දෙපාරක් දාන්න | - | இரு முறை போடுங்கள் |
| දෙක බැගින් | - | இரண்டு வீதம் |
| බෙහෙතක් | - | மருந்தொன்று |

# 04 මගෙ අම්මා



අම්මා අම්මා මා ආදර අම්මා
මගේ ම ආදර අම්මා

දස මස මා කුසේ දරා
ලේ කිරි කරලා මට පොවලා
මා තුරුලේ නිදි කරවා
මා ඇති දැඩි කළ මා ආදර අම්මා

අම්මා අම්මා මා ආදර අම්මා
මගේ ම ආදර අම්මා



කවි ගී කියලා
සුරතල් කරලා
තුරුලට අරගෙන
සෙනෙහස පාලා
මට බත් කැව්වා

අම්මා අම්මා මා ආදර අම්මා
මගේ ම ආදර අම්මා

කරුණා දයා ගුණෙන්
ඔවදන් දී
පාසල් යවලා
යහ මග පෙන්වන මා ආදර අම්මා

අම්මා අම්මා මා ආදර අම්මා
මගේ ම ආදර අම්මා

(ජාතික අධ්‍යාපන ආයතනයේ විෂය නිර්දේශයේ නිලධාරීන් පෙන්වාදුන් ගීතයකි. / තනුව: විශාරද එඩ්වඩ් ජයකොඩි - ස්වර ලිපිය 105 පිටුවේ ඇත.)

## ක්‍රියාකාරකම 01

**පිළිතුර තෝරන්න.**

*விடையைத் தெரிவு செய்யுங்கள்.*

i මෙම ගීතයෙන් කියවෙන්නේ කුමක් ගැන ද?
(i. දුක සැප ii. මව්ගුණ iii. හදවත)

ii අම්මා දරුවාගේ කුසගින්න නිවන්නේ කෙසේ ද?
(i. නිදි කරවා ii. ඔවදන් දී iii. කිරි දී )

iii අම්මා දරුවාට කෑම කැව්වේ කෙසේ ද?
(i. නිදි කරවමින් ii. නලවමින් iii. කවි ගී කියමින්)

iv දරුවා යැව්වේ කොහේට ද?
(i. පාසලට ii. ගෙදරට iii. කඩේට)

v පාසලට යවන්න කලින් අම්මා දරුවාට දුන්නේ මොනවා ද?
(i. මව්ගුණ ii. ඔවදන් iii. දුක සැප)

## ක්‍රියාකාරකම 02

**හිස්තැන් පුරවන්න. කියවන්න.**

*வெற்றிடங்களை நிரப்புங்கள். வாசியுங்கள்.*

| යවනවා, දෙනවා, කවනවා, නලවනවා, පෙන්වනවා |
|---|



i අම්මා දරුවා - ..................................

ii අම්මා බත් - ..................................

iii අම්මා ඔවදන් - ................................

iv දරුවා පාසලට - ................................

v යහ මග - ................................

## ක්‍රියාකාරකම 03

**සමාන වචන තෝරා ලියන්න.**

ஒத்தகருத்துச் சொற்களைத் தெரிவு செய்து எழுதுங்கள்.

**ඔවදන්, ගී, සෙනෙහස, පාසල, අම්මා**



i මව - ................................

ii විදුහල - ................................

iii සින්දු - ................................

iv ආදරය - ................................

v අවවාද - ................................

## ක්‍රියාකාරකම 04

**ගීතයේ සඳහන් මව්ගුණ ලියන්න.**

பாடலில் உள்ள தாயாரின் குணங்களை எழுதுங்கள்.



i **දස මස කුසේ දරා**

ii ...............................................

iii ...............................................

iv ...............................................

v ...............................................

vi ...............................................

## ක්‍රියාකාරකම 05

**මව්ගුණ කියවෙන ගීතය ගයන්න.**

*தாயாரின் குணங்களை கூறும் பாடலைப் பாடுங்கள்.*

ඔබ හදවත ලේ කිරි කරලා
රස කර දී කුස ගිනි නිවලා
ඔබ තුරුලේ නිදි කරවා
මා වැදූ මගේ අම්මා

පෙම්බර මාතා . . .

සුරතල් කර පාසලට යවා
ඔවදන් දී නිසි මග පෙන්වා
නිවන් පතා - නිවන් පතා
වඳිමි මගේ මාතා

පෙම්බර මාතා . . .

# වචන මාලාව

| | | |
|---|---|---|
| ලේ කිරි කරලා | - | இரத்தத்தைப் பாலாக்கி |
| නිදි කරවා | - | தூங்கச் செய்து |
| මා තුරුලේ | - | என்னை மடியில் |
| සුරතල් කරලා | - | செல்லம் கொடுத்து |
| ඔවදන් දී | - | புத்திமதிகளைக் கூறி |
| තුරුලට අරගෙන | - | மார்போடு அணைத்து |
| සෙනෙහස පාලා | - | அன்பு காட்டி |
| කරුණා දයා ගුණෙන් | - | கருணை ஆதரவுடன் |
| පාසල් යවලා | - | பாடசாலைக்கு அனுப்பி |
| යහ මග | - | நல்வழி |



# 05 ෆාමසියක් සොයා යයි

භාතිය පාසල් ගොස් ගෙදර ආවේ ය. ඔහුගේ මව ඔහුට **ෆාමසියට** ගොස් **බෙහෙතක්** ගෙන එන ලෙස කීවා ය. භාතිය ෆාමසියක් සොයා යයි. මුලින්ම "ඕෂධී" ෆාමසියට ගියේ ය.




මාමේ, මාමේ මේ බෙහෙත තියෙනවා ද?

මොකක් ද? කෝ බලන්න.

ඔය බෙහෙත අපි ළඟ නැහැ. **ඉවරවෙලා.**

බෙහෙත ඉවරවෙලා ද?

මාමේ, එහෙනම් **මේක තියෙන්නේ කොහේ ද?**

"සහන" ෆාමසියේ බලන්න. **එහේ ඇති.**

ඒ ෆාමසිය තියෙන්නේ කොහේ ද?

**ඒක තියෙන්නේ ඉස්සරහ හන්දියේ.**

**හුඟක් දුර ද?**

නෑ මේ ළඟ, **ටිකක් ඉස්සරහට** යන්න.

**කොච්චර විතර ද?**

මීටර් පණහක් විතර යන්න.

හොඳයි.

හන්දියේ **වම් පැත්තේ** "සරස්වතී" පොත්හල තියෙනවා.

**ඒක ඉස්සරහ** ෆාමසිය. ඒකේ බලන්න.

හොඳයි මාමේ. බොහොම ස්තුතියි!

ගිහින් එන්නම්.



## ක්‍රියාකාරකම 01

**පිළිතුරු කියන්න. ලියන්න.**

விடை சொல்லுங்கள். எழுதுங்கள்.



i භාතිය සොයා ගියේ කුමක් ද?

**(i. පොතක් ii. බෙහෙතක් iii. ගෙයක්)**

ii මුලින්ම ගිය ආමසිය කුමක් ද?

**(i. ඕෂධී ii. සරස්වතී iii සහන)**

iii පසුව සොයා ගිය ආමසියේ නම කුමක් ද?

**(i. සරස්වතී ii. සහන iii. ඕෂධී)**

iv ආමසිය ඉස්සරහ ඇති පොත්හලේ නම කුමක් ද?

**(i. සරවනා ii. සරස්වතී iii. සරසවි)**

v ඕෂධී ආමසියේ සිට සහන ආමසියට ඇති දුර කොපමණ ද?

**(i. මීටර් පණහක් ii. මීටර් සියයක් iii. මීටර් දහයක්)**

## ක්‍රියාකාරකම 02

**තෝරන්න. ලියන්න.**

தெரிவு செய்யுங்கள். எழுதுங்கள்.

| |
|---|
| **විතර, ඉස්සරහට, ඒකේ, ඉස්සරහ, එහේ** |

i "සහන" ෆාමසියේ බලන්න ...................... ඇති.

ii ඒක ඉස්සරහ ෆාමසිය. ...................... බලන්න.

iii ඒක තියෙන්නේ ...................... හන්දියේ.

iv ටිකක් ...................... යන්න.

v මීටර් පණහක් ...................... යන්න.



## ක්‍රියාකාරකම 03

**පහත සඳහන් වචන යොදා ප්‍රශ්න අහන්න. ලියන්න.**

பின்வரும் சொற்களைப் பயன்படுத்திக் கேள்விகளைக் கேளுங்கள். எழுதுங்கள்.

**උදාහරණ : පොත්හලේ නම මොකක් ද?**


i කොහේ ද? - ..............................

ii තියෙනවා ද? - ..............................

iii හුඟක් දුර ද? - ..............................

iv කොච්චර ද? - ..............................

v ඉවරවෙලා ද? - ..............................




## ක්‍රියාකාරකම 04

**දෙබසක් වශයෙන් ඉදිරිපත් කරන්න.**

*ஓர் உரையாடலாக சமர்ப்பியுங்கள்.*

**භාතිය** :- මාමේ, මේ බෙහෙත තියෙනවා ද?

**මාමා** :- මොකක් ද? කෝ බලන්න.
ඔය බෙහෙත අපි ළඟ නැහැ.
ඉවර වෙලා.



**භාතිය** :- මාමේ, එහෙනම් මේක තියෙන්නේ කොහේ ද?

**මාමා** :- "සහන" ෆාමසියේ බලන්න. එහේ ඇති.

**භාතිය** :- ඒක තියෙන්නේ කොහේ ද?

**මාමා** :- ඒක තියෙන්නේ ඉස්සරහ හන්දියේ.

**භාතිය** :- මෙතන ඉඳල හුඟක් දුර ද?

**මාමා** :- නැහැ. මීටර් පණහක් විතර.

**භාතිය** :- ස්තුතියි.

**මාමා** :- හොඳයි.

## ක්‍රියාකාරකම 05


**අත්තනගල්ල පාරේ සිටින මාධවන්ට පොත්හලට යන පාර කියන්න.**

*அத்தனகல்லைத் தெருவில் இருக்கின்ற மாதவனுக்கு புத்தகக் கடைக்குச் செல்லும் வழியைக் கூறுங்கள்.*



# වචන මාලාව

| | | |
|---|---|---|
| කොහේ ද? | - | எங்கே? |
| එහේ | - | அங்கே |
| ඒක තියෙන්නේ | - | அது இருப்பது |
| ඉස්සරහ | - | முன்னே |
| ටිකක් ඉස්සරහට | - | கொஞ்சம் முன்னுக்கு |
| කොච්චර විතර ද? | - | எவ்வளவு? |
| වම් පැත්තේ | - | இடப் பக்கத்தில் |
| ඒක ඉස්සරහ | - | அதன் முன்னே |
| ෆාමසියට | - | பாமசிக்கு |
| බෙහෙතක් | - | மருந்தொன்று |
| ඉවරවෙලා | - | முடிந்து விட்டது/ தீர்ந்து விட்டது |
| හන්දියේ | - | சந்தியில் |
| හුඟක් දුර ද? | - | அதிக தூரமா? |



# 06 යාළුවන් හමුවෙලා

අද අපේ පාසලේ නාට්‍යයක් පෙන්වනවා. නාට්‍යය බලන්න පාසලේ ළමයි, දෙමව්පියෝ හා ආදි ශිෂ්‍යයෝ හැමෝම පැමිණෙමින් සිටියා.

සඳුන් අර බලන්න. එන්නේ කවුද? කියලා.

කුමාර, ඒ කැලුම් අයියා නේ ද?

ඔව්, ඔව් එයා තමයි.

ආ . . . කැලුම් අයියේ.



**කාලෙකට පස්සෙ** හමු වුණේ. හරි ම සතුටු යි.

දැන් ඔයා **ඉන්නෙ කොහේ** ද?

මම ඉන්නෙ ගම්පහ.

රමේෂ් ඉන්නෙත් කොළඹ නේ ද?

නෑ සඳුන් එයා ඉන්නේ වවුනියාවේ.

එයා මොක ද කරන්නේ?

තව ම ඉගෙන ගන්නවා.

**(මේ අතර ශබ්ද විකාශන යන්ත්‍රයෙන් නිවේදනයක් නිකුත් වේ.)**

"කරුණාවෙන් සවන් දෙන්න.

මේ **නිවේදනය** විදුහලේ **ශිෂ්‍ය නායක නායිකාවන්ට** යි. අප විදුහලේ **වාර්ෂික** ව **පවත්වන** ගුරු **උපහාර උලෙළ**, මෙවරත් ඔක්තෝබර් මාසයේ හය වන දා පැවැත් වේ. ඒ පිළිබඳ **සාකච්ඡාවක්**, අද **පස්වරු 2.00ට ප්‍රධාන ශාලාවේ** දී, **පැවැත්වීමට නියමිත** ය. මෙම **සාකච්ඡාවට** සහභාගි වන ලෙස, **සියලු** ම ශිෂ්‍ය නායක නායිකාවන්ට, මෙයින් **දැනුම් දෙමි.**"

කුමාර, ඒ නිවේදනය කළේ රත්නායක සර් නේ ද?

ඔව් කැලුම්. සර් තමයි දැන් අපේ විදුහල්පතිතුමා.

හරිම සන්තෝෂ යි. සර්ට සුබ පතන්න ඕන.

ගුරු උපහාර උලෙළට ඔයාත් එනවා නේ ද?

ඔව්, ඔව් මමත් එනවා.

කැලුම්, මෙතනින් ඉඳගන්න.

හොඳයි. බොහොම ස්තුතියි.

## ක්‍රියාකාරකම 01

**පිළිතුරු කියන්න. ලියන්න.**

*விடை சொல்லுங்கள். எழுதுங்கள்.*



i යහළුවන් රැස් වූයේ කුමකට ද?

ii කැලුම් පදිංචි ව ඉන්නේ කොහේ ද?

iii ගම්පහ ඉස්කෝලයක ඉගෙන ගන්නේ කවුද?

iv නිවේදනය කුමක් ගැන ද?

v මෙම නිවේදනය කළේ කවුද?

## ක්‍රියාකාරකම 02

**වාක්‍ය සම්පූර්ණ කරන්න. දෙබසක් ලෙස ඉදිරිපත් කරන්න.**

*வசனங்களைப் பூர்த்தி செய்யுங்கள். உரையாடலாக முன்வையுங்கள்.*

**කොළඹ නේ ද?, කොහේ ද?, ගම්පහ, හමුවුණේ, කරන්නේ?**



i කාලෙකට පස්සේ .................

ii ඔයා ඉන්නේ .................

iii මම ඉන්නේ .................

iv සමන් ඉන්නේ .................

v එයා මොකද .................

## ක්‍රියාකාරකම 03

**මේ වාක්‍ය ලියන බසට හරවන්න.**

*இந்த வசனங்களை எழுத்து மொழிக்கு மாற்றுங்கள்.*

**උදාහරණය : කැලුම් එනවා. කැලුම් එයි.**

**එති, පැවැත්වෙයි, ගනියි, එමි, යමු**



i මම එනවා.

ii අපි යනවා.

iii යාළුවෝ එනවා.

iv කමල් ගම්පොළ පාසලක ඉගෙන ගන්නවා.

v සාකච්ඡාවක් පැවැත්වෙනවා.

## ක්‍රියාකාරකම 04

**මෙම නිවේදනයේ හිස්තැන්වලට සුදුසු වචන තෝරා ලියන්න.**

*இந்த அறிவித்தலின் வெற்றிடங்களுக்குப் பொருத்தமான சொற்களைத் தெரிவு செய்து எழுதுங்கள்.*

**ප්‍රධාන ශාලාවේ, දෙමව්පියන්, විදුහල්පතිතුමා, සවන්, සිකුරාදා, ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට යි, ශ්‍රේණියේ, රැස්වීමක්**



කරුණාවෙන් .............................. දෙන්න.

මේ දැන්වීම 10 වන ශ්‍රේණියේ සියලු ම ......................... ලබන ......................... පස්වරු 3.00ට 10 වන ..................... ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ දෙමව්පියන් සඳහා විශේෂ .................... විද්‍යාලයීය ......................... දී පැවැත්වේ. මේ පිළිබඳ ඔබගේ ............................. දැනුම්වත් කරන ලෙස .............. ................ දන්වා සිටියි.

## ක්‍රියාකාරකම 05

**නිවේදනය ලියන්න. කියවන්න.**

*அறிவித்தலை எழுதுங்கள். வாசியுங்கள்.*



කාරුණිකව **සවන්** දෙන්න.


මේ නිවේදනය **දෙවන බස සංගමයේ** සාමාජික සාමාජිකාවන්ටයි. අප විදුහලේ **මාසිකව** පැවැත්වෙන නිවේදන තරගය සඳහා සහභාගී වන ළමුන් අද **විවේක කාලයේ** දී **පුස්තකාලයට** පැමිණෙන්න.

## වචන මාලාව

| | | |
|---|---|---|
| කාලෙකට පස්සෙ | - | நீண்ட காலத்திற்குப் பின் |
| ඉන්නෙ කොහේ ද? | - | எங்கே இருக்கின்றீர்கள்? |
| නිවේදනය | - | அறிவித்தல் |
| ශිෂ්‍ය නායක නායිකාවන්ට | - | மாணவத் தலைவர்கள்/ தலைவிகளுக்கு |
| පස්වරු 2.00ට | - | பிற்பகல் 2.00க்கு |
| ශාලාවේ | - | மண்டபத்தில் |
| පැවැත්වීමට | - | நடத்துவதற்கு |
| සාකච්ඡාවට | - | கலந்துரையாடலுக்கு |
| දැනුම් දෙමි | - | அறிவிக்கின்றேன் |
| ගුරු උපහාර උළෙළ | - | ஆசிரியர் பாராட்டு விழா |




# 07 අපට ක්‍රීඩා සමාජයක්



උදාර, රගු, නවාස් හා ඇලෙක්ස් එක ම ගමේ යාළුවෝ. මේ අය, වැව ළඟ වෙලේ සෙල්ලම් කරනවා. කුඹුරු වැඩ කාලෙට සෙල්ලම් කරන්න තැනක් තිබුණේ නෑ. එදා ගොවියෝ කුඹුරු වැඩ. යාළුවෝ වැව ළඟ කතා කර කර සිටියා.

"නවාස් අපිටත් ක්‍රීඩා සමාජයක් තිබුණා නම් හොඳ යි නේ ද?" උදාර මෙසේ කියමින් ගලක් උඩ ඉඳගත්තා.



"එතකොට අපිට හැමදාම සෙල්ලම් කරන්නත් පුළුවන්." නවාස් කියනු ඇසුණා.

"අපි ක්‍රීඩා සමාජයක් පිහිටුවා ගනිමු." රගු ඉතා සතුටින් කීවා.

"මුලින් ම අපි, අපේ යාළුවන්ට ප්‍රජා ශාලාවට එන්න කියමු.

මම වැව පහළ යාළුවන්ට **කියන්නම්.**" උදාර කීවේ ය.

"හොඳයි මම කන්දෙ වත්තේ අයට කියන්නම්" යයි කියමින්

රගු, වැවට ගල් කැටයක් විසි කළේ ය.

එය "දියරැලි" නංවමින් වතුරට වැටුණි.

"ඇලෙක්ස් යාළුවන්ට එන්න **කියන්නේ කවදා ද?**"

"ලබන ඉරිදා උදේ දහයට එන්න කියමු."

"හොඳයි උදාර ඒ අයට කියන්නේ කවදා ද?"

"ඇලෙක්ස්, අද නම් **කියන්න වෙන්නේ නෑ.** හෙට **කියමු.**"

"අපි තරුණ සේවා නිලධාරිතුමාටත්, **ග්‍රාම නිලධාරිතුමාටත්** කියමු."

එයාලා ප්‍රාදේශීය ලේකම්තුමාට කියලා ක්‍රීඩා පිට්ටනියකුත් සකස් කරලා දේවි.

ඇලෙක්ස් දැඩි අධිෂ්ඨානයකින් කීවේ ය.

"අපි අපේ ක්‍රීඩා සමාජයට නමක් තියමු."

"එකමුතු ක්‍රීඩා සමාජය" කියලා.

"ඔව්, ඔව් ඒක හොඳ අදහස" නවාස් කීවේ ය.

"මුතු මෙන් එකමුතු වී
දිවි දී රකිමු අපේ ලංකා. . ."

කියමින් ඇලෙක්ස් නවාස් ළඟට පැමිණ දෑත් විහිදුවා ගායනා කළේ ය.

සියලු දෙනා ම සතුටින් එයට එකතු වූහ.

## ක්‍රියාකාරකම් 01

**පිළිතුරු ලියන්න.**

*விடைகளை எழுதுங்கள்.*

i ළමයි සෙල්ලම් කිරීමට එකතු වෙන්නේ කොතැනට ද?

ii එදා ඒ අය ක්‍රීඩා කළේ නැත්තේ ඇයි?

iii ළමයි කතා කළේ කුමක් ගැන ද?

iv ක්‍රීඩා සමාජයේ නම කුමක් ද?

v රැස්වීමට සහභාගි වන නිලධාරීන් කවුරුන්ද?



## ක්‍රියාකාරකම 02

**සමාන වචන සොයන්න. ලියන්න.**

ஒத்தக்கருத்துச் சொற்களை தேடுங்கள். எழுதுங்கள்.

| කුඹුර, යාළුවා, මුලින් ම, ක්‍රීඩා, හැමදාම |
|---|




i සෙල්ලම් - .......................

ii දිනපතා - .......................

iii මිතුරා - .......................

iv වෙල - .......................


v ඉස්සර වෙලා - .......................

## ක්‍රියාකාරකම 03

**සුදුසු වචන යොදා හිස්තැන් පුරවන්න.**

பொருத்தமான சொற்களைப் பயன்படுத்தி வெற்றிடங்களை நிரப்புங்கள்.

| අපි, අපිට, අපේ, අපි, අපිටත් |
|---|



i ............................ ක්‍රීඩා සමාජයක් තිබුණා නම් හොඳයි.

ii ............................ හැමදා ම සෙල්ලම් කරන්න පුළුවන්.

iii ............................ ක්‍රීඩා සමාජයක් පිහිටුවා ගනිමු.

iv ............................ තරුණ සේවා නිලධාරිතුමාටත් කියමු.

v ............................ ක්‍රීඩා සමාජයට නමක් තියමු.

## ක්‍රියාකාරකම 04

**උදාහරණය බලන්න. බහු වචනයට හරවා ලියන්න.**

*உதாரணத்தைப் பாருங்கள். பன்மைச் சொற்களாக மாற்றி எழுதுங்கள்.*

**උදාහරණය :** **යාළුවා කතා කර කර සිටියේ ය.**
**යාළුවෝ කතා කර කර සිටියෝ ය.**



i යාළුවා සෙල්ලම් කර කර සිටියේ ය.

ii ළමයා ගලක් උඩ ඉඳ ගත්තේ ය.

iii ළමයා ඉතා සතුටින් ගීතය ගායනා කළේ ය.

iv ඔහු දැඩි අධිෂ්ඨානයකින් කීවේ ය.

v ඔහු ක්‍රීඩා සමාජයට නමක් තැබුවේ ය.

## ක්‍රියාකාරකම 05

**රටාව බලන්න. ලියන්න.**

*மாதிரியைப் பாருங்கள். எழுதுங்கள்.*


| කියනවා | කියන | කියන්න | කියන්නේ | කියද්දී |
|---|---|---|---|---|
| රකිනවා | | | | |
| කරනවා | | | | |
| කතා කරනවා | | | | |
| වීසි කරනවා | | | | |
| සකස් කරනවා | | | | |
| එකතු වෙනවා | | | | |
| සිනා සෙනවා | | | | |



# වචන මාලාව

| | | |
|---|---|---|
| කියන්නම් | - | சொல்கிறேன் |
| කියන්නේ කවදා ද? | - | எத்தினத்தில் சொல்வது? |
| කියන්න වෙන්නේ නෑ | - | சொல்ல நேரிடுவதில்லை |
| ග්‍රාම නිලධාරිතුමාට | - | கிராம சேவகருக்கு |
| කියමු | - | சொல்வோம் |
| කියන | - | சொல்லும் |
| කියන්න | - | சொல்லுங்கள் |
| කියන්නේ | - | சொல்லுவது |
| කියද්දී | - | சொல்லும் போது |





# 08 වලහා කී රහස



රාජා යි, නිමලු යි හොඳ යාළුවෝ.

මේ දෙන්නා දවසක් කැලේ මැදින් ගමනක් ගියා.



ටික දුරක් යන කොට වලහෙක් ඉන්නවා දැක්කා.
දෙන්නා හොඳට ම බය වුණා.
“අපි ගහකට නගිමු” රාජා කිව්වා.

“මට ගස් නගින්න බෑ.” නිමල් කිව්වා.

රාජා ඉක්මනට ඉක්මනට ගහ උඩට නැග්ගා.



“අනේ! යාළුවේ මටත් උදව් කරන්නකෝ.”
නිමල් රාජාට කිව්වා.

“ඔයා මැරුණා වගේ ගහ යට නිදා ගෙන ඉන්න.”
“මම අතු අස්සේ හැංගෙන්නම්” රාජා කිව්වා.

වලහා කිට්ටුවට එන කොට,
නිමල් ගහ ළඟ වැටිලා, මැරුණා වගේ හිටියා.



වලහා නිමල් ළඟට ඇවිත්
මුළු ඇඟ ම ඉව කරලා බලලා යන්න ගියා.

ගහ උඩ හිටිය රාජා බිමට බැස්සා.

බැහැලා ඉක්මනට නිමල් ළඟට ආවා.



යාළුවේ! යාළුවේ! වලහා රහසින් කිව්වේ මොකක් ද?

"විපතක දී උදව් කරන කෙනා තමයි හොඳ ම යාළුවා" කියලා වලහා කිව්වා.

## ක්‍රියාකාරකම 01

**පිළිතුරු කියන්න. ලියන්න.**

விடை சொல்லுங்கள். எழுதுங்கள்.



i ගසට නැග්ගේ කවුද?

ii "අනේ! යාළුවේ මටත් උදව් කරන්න." මෙසේ කීවේ කවුද?

iii වලහාගෙන් බේරීමට නිමල් කළේ කුමක් ද?

iv වලහා නිමල් ළඟට පැමිණ කළේ කුමක් ද?

v වලහා කී රහස කුමක් ද?

## ක්‍රියාකාරකම 02

**කතාව පිළිවෙළට ගොඩ නඟා ලියන්න.**

கதையை ஒழுங்காக அமைத்து எழுதுங்கள்.




i රාජා උස ගහකට නැග්ගා.

ii ඈතින් වලහෙක් එනවා දැක්කා.

iii නිමල් මැරුණා වගේ හිටියා.

iv රාජා නිමල් එක්ක ගමනක් ගියා.

v වලහා ළඟට ම ආවා.

vi වලහා නිමල්ට රහසක් කීවා.

## ක්‍රියාකාරකම 03

**පාඩම කියවන්න. වාක්‍ය සම්පූර්ණ කරන්න.**

பாடத்தை வாசியுங்கள். வசனங்களைப் பூர்த்தி செய்யுங்கள்.

i වලහා කිට්ටුවට ..................................

ii නිමල් ගහ ළඟ වැටිලා ..............................

iii මුළු ඇඟම ඉව කරලා බලලා ..............................

iv බැහැලා ඉක්මනට නිමල් ..............................

v යාළුවේ! යාළුවේ! වලහා රහසින්...........................



## ක්‍රියාකාරකම 04

### විරුද්ධ වචන සොයන්න. ලියන්න.

எதிர்கருத்துச் சொற்களை தேடுங்கள். எழுதுங்கள்.

i බිමට - ......................

ii නැග්ගා - ......................

iii ගියා - ......................

iv දුර - ......................

v එන කොට - ......................



## ක්‍රියාකාරකම 05

### ලියන බසට හරවන්න.

எழுத்து மொழிக்கு மாற்றி எழுதுங்கள்.

**නැග්ගේ ය, වූවෝ ය, ගත්තේ ය, ගියෝ ය, ආවේ ය, කිව්වේ ය**


i යාළුවෝ ගමනක් ගියා. - ..............................

ii වලහෙක් කැලේ මැදින් ආවා. - ..............................

iii රාජා ගහට නැග්ගා. - ..............................

iv නිමල් බිම නිදා ගත්තා. - ..............................

v වලහා රහසක් කිව්වා. - ..............................



# වචන මාලාව

| | | |
|---|---|---|
| දෙන්නා | - | இருவர் |
| ටික දුරක් යන කොට | - | சிறிது தூரம் செல்லும் போது |
| උඩට නැග්ගා | - | மேலே ஏறினார் |
| කිට්ටුවට එන කොට | - | சமீபத்துக்கு வரும் போது |
| ගහ උඩ | - | மரத்தின் மேலே |
| හොඳ යාළුවෝ | - | நல்ல நண்பர்கள் |
| ගමනක් | - | பயணமொன்று |
| හොඳට ම | - | நன்றாக |
| මට ගස් නගින්න බෑ | - | எனக்கு மரம் ஏற முடியாது |
| මැරුණා වගේ | - | மரணித்தவர் போன்று |
| ඇඟ ම ඉව කරලා | - | உடம்பை முகர்ந்து பார்த்து |
| හැංගෙන්නම් | - | ஒளிந்துகொள்கிறேன் |
| ගහකට නගිමු | - | மரமொன்றுக்கு ஏறுவோம் |
| බැහැලා | - | இறங்கி |
| විපතක දී උදව් කරන කෙනා තමයි | - | ஆபத்தொன்றின் போது உதவிசெய்பவர்தான் |
| රහසින් | - | இரகசியமாக |

# 09 අලි බලන්න යමු

බලංගොඩ **“දිලෙන තරු”** **ළමා සමාජයේ** සාමාජිකයෝ වාර්ෂික ව **චාරිකාවක්** යති. මෙවර ඔවුහු පින්නවල අලි නිවහනට යාමට තීරණය කළහ. සියලු දෙනා ම සුජිත් මාමාගේ වෑන් **රථයෙන්** **ගමන** පිටත් වූහ. රථය පින්නවල **අලි නිවහනට** ළඟා විය.

රවී, ඔයාත් බැහැලා යන්න.

ඇයි ඒ . . . ?

**භාණ්ඩාගාරික** ඔයා නෙ, ඔයා ටිකට් ගන්න.



හොඳයි නවාස්, මම ටිකට් ගන්නම්.

ගන්නේ කොහෙන් ද ?

අර දොරටුව ළඟ කවුන්ටරයෙන්.

එන්න රවි, අපි යමු.

මාමේ, ටිකට් එකක් කීය ද?

ලොකු අයෙකුට හැටයි. ළමයෙකුට තිහයි.

ටිකට් කීයක් ඕන ද?

හැටේ ඒවා දොළහක් දෙන්න.

තව . . . තිහේ ඒවා තුනක් දෙන්න.

ආ, මෙන්න. ඔක්කොම ටිකට් පහළොවයි.

කීය ද ගණන?

අටසිය දහය යි.

මෙන්න දාහක්. මේකෙන් ගන්න.

මෙන්න ඉතුරු සල්ලි.

අලි නිවහන කීයට ද වහන්නේ මාමේ ?

හවස හයට.

අලි නාවන්නේ කොහේ ද?

එහා පැත්තෙ ඔයේ,

මාමේ අලි සෙල්ලම් තියෙනවා ද?

පුතාලා ඇතුළට ගිහිල්ලා බලන්න.

හුඟාක් දේවල් බලන්න තියෙනවා.

හොඳයි මාමේ, බොහොම ස්තුතියි.

## ක්‍රියාකාරකම 01

**පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු කියන්න.**

*பின்வரும் வினாக்களுக்கு விடை கூறுங்கள்.*

i ළමයි පින්නවල ගියේ ඇයි?

ii ටිකට් ගත්තේ කොහෙන් ද?

iii ළමා සමාජයේ භාණ්ඩාගාරික කවුද?

iv ටිකට් කීයක් මිල දී ගත්තා ද?

v අලි නිවහන වහන්නේ කීයට ද?



## ක්‍රියාකාරකම 02

**හිස්තැන් පුරවන්න. කියන්න.**

*வெற்றிடங்களை நிரப்புங்கள். கூறுங்கள்.*

| |
|---|
| **කීයක්, දොළහක්, එක්කෙනෙකුට, ඔක්කොම, එකක්** |

i මාමේ ටිකට් ......................... කීයද?

ii ලොකු ......................... හැටයි.

iii ටිකට් ......................... ඕන ද?

iv හැටේ ඒවා ......................... දෙන්න.

v මෙන්න ......................... ටිකට් පහළොවයි.



## ක්‍රියාකාරකම 03

**යා කරන්න.**

தொடர்புபடுத்துங்கள்.



| | | |
|---|---|---|
| i | ළමා සමාජය | ඔයේ |
| ii | භාණ්ඩාගාරික | පින්නවල |
| iii | කවුන්ටරය | දිලෙන තරු |
| iv | අලි නිවහන | ටිකට් ගන්න |
| v | අලි නාවන්නේ | දොරටුව ළඟ |

## ක්‍රියාකාරකම 04

**ලියන බසට හරවන්න.**

எழுத்து மொழிக்கு மாற்றுங்கள்.

**විය, කළහ, ගියෝ ය, ගියෙමු, යති, වූහ**

i ළමා සමාජයේ සාමාජිකයෝ චාරිකාවක් යනවා.

.............................................................................

ii ඔවුහු පින්නවල යාමට තීරණය කළා.

.............................................................................

iii ඔවුහු වෑන් රථයෙන් ගමන පිටත් වුණා.

.............................................................................



iv වෑන් රථය අලි නිවහනට ළඟා වුණා.

.........................................................................

v අපි කවුන්ටරය ළඟට ගියා.

.........................................................................


vi පුතාලා ඇතුළට ගියා.

.........................................................................

## ක්‍රියාකාරකම 05

**කියවන්න.**

*வாசியுங்கள்.*



| | | | | |
|---|---|---|---|---|
| i | තුන | - තුනේ | - තුනට | - තුනයි |
| ii | හය | - හයේ | - හයට | - හයයි |
| iii | දහය | - දහයේ | - දහයට | - දහයයි |
| iv | දොළහ | - දොළහේ | - දොළහට | - දොළහයි |
| v | පහළොව | - පහළොවේ | - පහළොවට | - පහළොවයි |
| iv | තිහ | - තිහේ | - තිහට | - තිහයි |
| v | හැට | - හැටේ | - හැටට | - හැටයි |
| vi | අටසීය | - අටසීයේ | - අටසීයට | - අටසීයයි |
| vii | දාහ | - දාහේ | - දාහට | - දාහයි |


## වචන මාලාව

| | | |
|---|---|---|
| ගන්නේ කොහෙන් ද? | - | எங்கே எடுப்பது? |
| ලොකු අයෙකුට | - | பெரியவர் ஒருவருக்கு |
| ළමයෙකුට | - | ஒரு பிள்ளைக்கு |
| කීයක් ඕන ද? | - | எவ்வளவு வேண்டும்? |
| කීයට ද? | - | எத்தனை மணிக்கு? |
| දිලෙන තරු | - | மின்னும் நட்சத்திரங்கள் |
| ළමා සමාජයේ | - | சிறுவர் மன்றத்தில் |
| රථයෙන් ගමන | - | வாகனப் பயணம் |
| අලි නිවහනට | - | யானை சரணாலயத்துக்கு |
| භාණ්ඩාගාරික | - | பொருளாளர் |
| කවුන්ටරයෙන් | - | கவுண்டரில் |
| දොරටුව | - | கதவடியில் |
| වාර්ෂිකව | - | வருடாந்தம் |
| චාරිකාවක් | - | சுற்றுலா |





# 10 වැසි දිනයක්



අපේ පාසලේ **තෑගි බෙදාදීමේ උත්සවය** ලබන සඳුදා පැවැත්වෙනවා. එහි **පිළිගැනීමේ ගීතය** ගයන්නේ අපියි. ගීතය පුරුදු වීමට සෙනසුරාදා උදේ ම පාසල් එන්න කියලා ටීචර් අපට කීවා. විදුරත්, මමත් බස් එකෙන් බැහැලා පාසල් වත්තට ඇතුළු වුණා. “චට පටාස්” හඬ **නගමින්** විදුලි එළියක් විහිදුණා. ඒ සමග ම ගස් **අඹරවමින්** තද **සුළඟක්** හමා ගියා.

පසන්, වැස්සක් වහින්නයි හදන්නේ.

ඔව්! ඔව්! ඔන්න **ගොරවනවා.** ඉක්මනට පන්තියට දුවමු.

විදුර, ඔන්න **හයියෙන්** ම වැස්ස වහිනවා.

අන්න, සාලියත් එනවා. සාලිය හොඳට ම තෙමිලා.

මග දී වැස්සට අහුවුණා විදුර, කෝ . . . තව ම අපේ යාළුවෝ ඇවිත් නැහැ නේ ?

මේ වැස්සේ **කොහොම** ද එන්නේ සාලිය?

අර ඇතින් කුඩයක් **ඉහළගෙන** කවුද එනවා පේනවා.

ආ . . . ඒ එන්නේ සංගීත ටීචර්.

පසන්, ටීචර් **හොඳට ම තෙමිලා.**



බලන්නකෝ ළමයි, කුඩේ ඉහළගෙන ඇවිල්ලත් තෙමුණා නේ.

කෝ හැමෝ ම ඇවිත් නැහැ නේ.

එළියට බහින්නේ කොහොම ද ටීචර්, පුදුම වැස්සක් නේ වහින්නේ.

තෑගි බෙදාදීමේ උත්සවය සඳුදා නේ, පිළිගැනීමේ ගීතය පුරුදු වෙන්නේ කවදා ද?

**ටික වේලාවක්** බලමු ටීචර්,

ටීචර් ! අපි හෙට ගීතය පුරුදු වෙමු ද?

විදුර, හෙට අනිත් ළමයි එන්නේ කොහොම ද?

ටීචර්, තාරුකා ඉන්නේ පසන්ගේ ගෙවල් ළඟ.
එයාට පුළුවන් තාරුකාට කියන්න.

සාලියට පුළුවන් ගයනිට කියන්න.

ඔව් ටීචර්, අපි අනිත් අයටත් කියන්නම්.

එහෙනම් ඉතින් හෙට පුරුදු වෙමු.

කීයට ද ටීචර් එන්න ඕන?

උදෙන් ම එන්න.

වෙනදා එන වෙලාවට,

රවිඳු ඔයාගේ **වයලීනයත්** අරගෙන එන්න.

එහෙනම් ඔයාලා **පරිස්සමින්** ගෙදර යන්න.

හොඳයි ටීචර්.

## ක්‍රියාකාරකම 01

### පිළිතුරු කියන්න. ලියන්න.

விடைகளைக் கூறுங்கள். எழுதுங்கள்.



i වැස්සට පෙර පරිසරයේ ඇති වන වෙනස්කම් මොනවා ද?

ii එදින ළමයි පාසලට රැස්වුණේ ඇයි?

iii ගුරුතුමිය ප්‍රමාද වූයේ ඇයි?

iv තෑගි බෙදා දීමේ උත්සවය කවදා ද?

v තාරුකාට පණිවිඩය කියන්නේ කවුද?

## ක්‍රියාකාරකම 02

### සුදුසු වචන සොයන්න. ලියන්න.

பொருத்தமான சொற்களைத் தேடுங்கள். எழுதுங்கள்.

**වහින්නේ, තෙමිලා, තවම, එන්නේ, කොහොම ද**

i කෝ .................................... අපේ යාළුවෝ ඇවිත් නැහැනේ.

ii එළියට බහින්නේ .................................... ටීචර්?

iii පුදුම වැස්සක්නේ ....................................

iv අර ඇතින් කවුද ....................................?

v ටීචර් හොඳට ම ....................................



## ක්‍රියාකාරකම 03

**දෙබස් චරිතවලට බෙදී කියවන්න.**

*உரையாடலைப் பாத்திரங்களாகப் பிரித்து வாசியுங்கள்.*



විදුර :- වැස්සක් වහින්නයි හදන්නේ.

පසන් :- ඔව් ඔව් ඔන්න ගොරවනවා.

සාලිය :- මග දී වැස්සට අහුවුණා.

ටීචර් :- කෝ හැමෝම ඇවිත් නැහැ නේ.

විදුර :- ටීචර් තාරුකා ඉන්නේ පසන්ගේ ගෙවල් ළඟ.

ටීචර් :- එහෙනම් ඉතින් හෙට පුරුදු වෙමු.

## ක්‍රියාකාරකම 04

**හිස්තැන් පුරවන්න. කියවන්න.**

*வெற்றிடங்களை நிரப்புங்கள். வாசியுங்கள்.*

i ............................................. කොහොම ද?

ii ............................................. තියෙන්නේ කවදා ද?

iii ............................................. එන්න පුළුවන් ද?

iv ............................................. පුරුදු වෙමු ද?

v ............................................. කීයට ද?



## ක්‍රියාකාරකම 05

### වැසි දිනක ඔබ දුටු දේ ලියන්න. කියවන්න.

*மழை நாளொன்றில் நீங்கள் கண்டவற்றை எழுதுங்கள். வாசியுங்கள்.*

i  ..............................................

ii  ..............................................

iii  ..............................................

iv  ..............................................

v  ..............................................


# වචන මාලාව

| | | |
|---|---|---|
| ගොරවනවා | - | இடிக்கிறது |
| කොහොම ද ? | - | எப்படி ? |
| ඉහළගෙන | - | விரித்துப் பிடித்துக் கொண்டு |
| හොඳට ම තෙමිලා | - | நன்றாக நனைந்து |
| නැහැ නේ | - | இல்லையே ? |
| ටික වේලාවක් | - | சிறிது நேரம் |
| නගමින් | - | சத்தம் எழுப்பிக் கொண்டு |
| අඹරවමින් | - | முறுக்கிக் கொண்டு |
| සුළඟක් | - | ஒரு காற்று |
| හයියෙන් | - | உரத்து |
| ඇවිල්ලත් | - | வந்தும் |
| තෙමුණා | - | நனைந்தார் |
| පුදුම | - | புதுமை/ ஆச்சரியம் |
| වයලීනයත් | - | வயலீனையும் |
| තෑගි බෙදාදීමේ උත්සවය | - | பரிசளிப்பு விழா |
| පිළිගැනීමේ ගීතය | - | வரவேற்பு க்கீதம் |
| පරිස්සමින් | - | பத்திரமாக/கவனமாக |
| පරිසරයෙන් | - | சுற்றாடலில் |



11

# මිතුරෙකුගෙන් ලිපියක්





නො. 146/50,
ඉහළ වීදිය,
ගමේවෙල,
පස්සර.
2021.08.05

ජය වේවා!

හිතවත් විරාජ්,

මම ගයාන්. මේ ලියුම **ලියන්නේ** මාස හයකට විතර පස්සෙනේ. ඉතින් විරාජ්, ඔයාලාගේ සැප සනීප කෙසේ ද? අපි නම් සැපෙන් සිටිනවා. ලබන සිකුරාදා අපිට නිවාඩු දෙනවා.

නිවාඩු කාලේ නුවර යමු කියලා අම්මා **කිව්වා.** අපේ මල්ලී නුවර එන්න හරිම කැමතියි. එයාට ඕන පහළ ඔයේ **පීනන්න.** මම නම් එන්නේ රඹුටන් කන්න. අපි ආවොත් මේ පාරත් රඹුටන් කඩල දෙනවා නේද? ගිය පාර අපි රඹුටන් මල්ලක් ගෙදරත් ගෙනාවා. මෙහේ දී රඹුටන් **කනකොට** ඔයාලගෙ වත්ත මතක් වෙනවා.

අපි එන්නේ සතියේ මැද දවසක. මම සෙනසුරාදා දිනවල දෙවන බස (දෙමළ) **පාඨමාලාවක්** හදාරනවා. ඔයාට තව ටිකක් සිංහල ඉගෙන ගන්න ආසයි කිව්වා නේද? එතන සිංහල භාෂා පාඨමාලාවකුත් තියෙනවා. ඔයාට **අයදුම් පතක්** තැපෑලෙන් ගෙන්වා ගන්න පුළුවන්.

අධ්‍යක්ෂ, භාෂා අංශය, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව, බදුල්ල, යන ලිපිනයට ඔයාගෙ ලිපිනය **ලියපු,** මුද්දර **අලවපු** ලියුම් කවරයක් සමග ලිපියකින් ඉල්ලීමක් කරන්න.

අපි **එනකොට** ඔයාට කිතුල් පැණියි, හකුරුයි ගේන්නම්. ඉතින් විරාජ් පවුලේ සියලු දෙනා ම මතක් කළා කියන්න. ඔයාලට බුදු සරණයි!.

මෙයට,
ගයාන්.

## ක්‍රියාකාරකම 01

**පිළිතුරු ලියන්න.**

விடை எழுதுங்கள்.

i ගයාන්ගේ ගම කොහේ ද?

ii ගයාන් නිවාඩු කාලයේ යන්නේ කොහේ ද?

iii විරාජ්ට ගෙන එන්නේ මොනවා ද?


iv ගයාන් එන්නේ කුමක් සඳහා ද?

v අයදුම් පත ගෙන්වා ගන්නේ කොහෙන් ද?

## ක්‍රියාකාරකම 02

**පහත දැක්වෙන ලියුමේ හිස්තැන්වලට සුදුසු වචනය ලියන්න.**

பின்வரும் கடிதத்தில் வெற்றிடங்களுக்குப் பொருத்தமான சொற்களைத் தெரிவு செய்து எழுதுங்கள்.



......................................
......................................
......................................

...................................... !

...................... විරාජ්,

මේ ලියුම ලියන්නේ ................. ඉතින්................. ඔයාලාගෙ ................. කෙසේ ද? අපි නම් ................. සිටිනවා. අපිට .................දෙනවා. මල්ලී .................එන්න. අපි එනකොට ඔයාට .................ගේනවා. ඉතින් විරාජ් පවුලේ ................. දෙනාම මතක් කළා .................

.................

ගයාන්.

## ක්‍රියාකාරකම 03

**දී ඇති ආකෘතිය බලන්න. කියවන්න.**

*வழங்கப்பட்டுள்ள மாதிரியை பாருங்கள். வாசியுங்கள்.*

යවන්නාගේ නම,

ලිපිනය

දිනය

..........................................

..........................................

..........................................

ලබන්නාගේ තනතුර හා ලිපිනය

....................................

....................................

....................................

ආමන්ත්‍රණය

....................................

මාතෘකාව ................................................

අවශ්‍ය කාරණය ...........................................................................

...........................................................................................................

...............................



ස්තුතියි !

යවන්නාගේ අත්සන

....................................

## ක්‍රියාකාරකම 04

**ඉහත ආකෘතිය යොදා ගන්න. දී ඇති කොටස් ගළපා රාජකාරි ලිපිය සකසන්න.**


*மேலே மாதிரியை பயன்படுத்துங்கள். கொடுக்கப்பட்டுள்ள பகுதிகளை ஒழுங்குபடுத்தி உத்தியோகக் கடிதமொன்றை தயார் செய்யுங்கள்.*

අධ්‍යක්ෂ,
භාෂා අංශය,
පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව,
බදුල්ල.

ස්තුතියි!

අධ්‍යක්ෂතුමනි,

විරාජ්.



දෙවන බස සිංහල පාඨමාලාව හැදෑරීම.


විරාජ්,
අංක 50, කටුගස්තොට,
මහනුවර.

ඉහත පාඨමාලාව හැදෑරීම සඳහා අයදුම් පතක් එවන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි.

## ක්‍රියාකාරකම 05

**රාජකාරි හා පෞද්ගලික ලියුමක ඇතුළත් විය යුතු කරුණු වෙන්කර ලියන්න.**

உத்தியோகக் கடிதத்திலும் தனிப்பட்ட கடிதத்திலும் அடங்கியிருக்க வேண்டிய விடயங்களைப் பிரித்து எழுதுங்கள்.



## වචන මාලාව

ඔයාලාගේ - உங்களது

කිව්වා - சொன்னார்

කනකොට - சாப்பிடும் போது

අයදුම් පතක් - விண்ணப்பப் படிவமொன்று

ලියපු - எழுதிய

අලවපු - ஒட்டிய

එනකොට - வரும்போது

ලියන්නේ - எழுதுவது

පීනන්න - நீந்துங்கள்

යවන්නාගේ අත්සන - அனுப்புபவரின் கையொப்பம்

ලිපිනය - முகவரி


ලබන්නාගේ - பெறுபவரின்

තනතුර - பதவி


පණිවිඩය - செய்தி

ආමන්ත්‍රණය - விளிப்பு

# 12 චිත්‍ර ප්‍රදර්ශනයක්



මනුරත් මමත් එදා **උදෑසනින්** ම පාසල වෙත **පැමිණියෙමු**. පාසලේ ප්‍රධාන ගේට්ටුව අසල වර්ණවත් දැන්වීමක් **එල්ලා** **තිබුණි**. විමල් ශබ්ද නගා එය කියවන්නට විය.



"විමල්, අපිත් චිත්‍ර ප්‍රදර්ශනය බලන්න යමු ද?"

"ඔව්, චිත්‍ර සර්ටත් කියලා සර් එක්ක ම යමු."

අපි කෝල් එකක් දීලා විස්තර අහමු.

මනුර, කෝල් එකක් ගන්නෙ **කොහොම** ද?

ප්‍රින්සිපල් සර්ට කියලා ගනිමු.

"හොඳයි ගිහින් කතා කරලා බලමු"

"සර් බණ්ඩාරවෙල නගර ශාලාවේ චිත්‍ර ප්‍රදර්ශනයක් පැවැත්වෙනවා. අපිට විස්තර දැනගන්න මේ දුරකථන අංකයට කෝල් එකක් ගන්න **පුළුවන්** ද?"

"එන්න මනුර, ඔයා ම කතා කරන්න.
මම ඔයාලට කෝල් එකක් අරගෙන දෙන්නම්."

"**ආයුබෝවන්!** බණ්ඩාරවෙල නගර ශාලාවෙන් ද **කතා කරන්නේ**?"

"ඔව්, මේ කතා කරන්නේ නගර ශාලාවෙන්.
දැනගන්න ඕනෑ **මොකක්** ද?"

"මම කතා කරන්නේ කල්මුනේ මහා විද්‍යාලයෙන්. අපිට චිත්‍ර ප්‍රදර්ශනය ගැන විස්තර ටිකක් දැනගන්න **පුළුවන්** ද?"

"ඔව් පුළුවන්. **මොනවා** ද දැන ගන්න ඕනෑ"

"චිත්‍ර ප්‍රදර්ශනය බලන්න එන්නේ **කොහොම** ද?"

"ඔයාලා මුලින් ම වැලිමඩට එන්න. වැලිමඩින් බණ්ඩාරවෙලට එන්න.

බණ්ඩාරවෙල ප්‍රධාන බස් නැවතුමේ ඉඳලා ඇටම්පිටිය පාරේ

මීටර් සීයක් ඉස්සරහට එන්න."

"වම් පැත්තේ නගර ශාලාව."

හොඳයි මාමේ . . . පටන් ගන්නේ කීයට ද?

"උදේ නවයට පටන් ගන්නවා. හවස පහට අවසන් වෙනවා."

"ප්‍රවේශ පත්‍ර ගන්න ඕනෑ ද?"

"ප්‍රවේශ පත්‍ර ලබා ගන්න ඕනෑ. එදාට දොරටුවෙන් ගන්න පුළුවන්."

"හොඳයි මාමේ, බොහොම ස්තුතියි."

පුතාලට සුබ දවසක් වේවා ! .

## ක්‍රියාකාරකම 01

**පිළිතුරු ලියන්න.**

*விடைகளை எழுதுங்கள்.*



i ප්‍රදර්ශනයේ නම කුමක් ද?

ii ප්‍රදර්ශනය පැවැත්වෙන්නේ කොහේ ද?

iii ප්‍රදර්ශනය පටන් ගන්නේ කීයට ද?

iv නගර ශාලාව තියෙන්නේ කුමන පාරේ ද?

v ප්‍රවේශ පත්‍ර ගන්නේ කොහෙන් ද?


## ක්‍රියාකාරකම 02

**සුදුසු වචන යොදා හිස්තැන් පුරවන්න.**

பொருத்தமான சொற்களைப் பயன்படுத்தி வெற்றிடங்களை நிரப்புங்கள்.

**චිත්‍ර ප්‍රදර්ශනය, විස්තර, ප්‍රධාන දොරටුව, ශබ්ද නඟා, දැන්වීමක්**

පාසලේ ............................ අසල වර්ණවත් ............................ එල්ලා තිබුණි. විමල් ............................ එය කියවන්නට විය. අපිත් ............................ බලන්න යමු ද? අපි කෝල් එකක් දීලා ............................ අහමු.



## ක්‍රියාකාරකම 03

**තෝරන්න. ලියන්න.**

தெரிவு செய்யுங்கள். எழுதுங்கள்.



මොකක් ද දැනගන්න ඕනෑ ?

නගර ශාලාව තියෙනවා.

කල්මුනේ මහා විද්‍යාලයෙන්.

නගර ශාලාවෙන් ද කතා කරන්නේ?

බලන්න එන්නේ කොහොම ද?

i ආයුබෝවන් ඔය බණ්ඩාරවෙල .....................

ii ඔව් .....................

iii චිත්‍ර ප්‍රදර්ශනය .....................

iv වම් පැත්තේ .....................

v මම කතා කරන්නේ .....................



## ක්‍රියාකාරකම 04

**හිස්තැන් පුරවන්න. කියන්න.**

*வெற்றிடங்களை நிரப்புங்கள். கூறுங்கள்.*

**කීයට ද?, පුළුවන් ද?, කොහොම ද?, මොකක් ද?, ඕනෑ ද?**

i ඔව් දැනගන්න ඕනෑ .....................

ii චිත්‍ර ප්‍රදර්ශනය ගැන විස්තර දැනගන්න .....................

iii ප්‍රදර්ශනය බලන්න එන්නෙ .....................

iv පටන් ගන්නේ .....................

v ප්‍රවේශ පත්‍ර ගන්න .....................



## ක්‍රියාකාරකම 05

### හිස්තැන් පුරවන්න.

*வெற்றிடங்களை நிரப்புங்கள்.*


**එන්න බලන්න.**

................................ චිත්‍ර ප්‍රදර්ශනය
අප්‍රේල් ............... සිට ............... දක්වා
බණ්ඩාරවෙල ................................ දී
දිනපතා උදේ ............... සිට ............... දක්වා
පැවැත්වේ.

විමසීම් ................................




## වචන මාලාව



| | | |
|---|---|---|
| ආයුබෝවන් ! | - | வணக்கம் ! |
| මොකක් ද? | - | என்ன? |
| පුළුවන් ද? | - | முடியுமா? |
| මොනවා ද? | - | என்ன? |
| කොහොම ද? | - | எப்படி? |
| පටන් ගන්නේ | - | ஆரம்பிப்பது |
| ලබා ගන්න ඕනෑ | - | பெற்றுக் கொள்ளவேண்டும் |
| සුබ දවසක් වේවා ! | - | நல்ல நாளாகட்டும் ! |
| උදෑසනින් | - | காலையில் |
| පැමිණියෙමු | - | சமூகமளித்தோம் / வந்தோம் |
| අනෙක් අය | - | மற்றவர்கள் |
| කතා කරන්නේ | - | பேசுவது |
| ප්‍රවේශ පත්‍ර | - | நுழைவுச்சீட்டு |

# 13 සඳලිගේ වාසනාව



"සුබ උදෑසනක්! අද අපේ පාසලට විශේෂ දවසක්. මේ වසරේ සිංහල භාෂා තරගය ගිය සුමානේ **කොළඹ දී** පැවැත්වුණා. එහි "**කථික**" හා "**නිවේදන**" අංශවල රන් පදක්කම් අපේ පාසලට ලැබුණා. එම **ජයග්‍රහණ** ලබා ගත්තේ දහවන ශ්‍රේණියේ සඳලි වක්වැල්ල **සිසුවිය** යි. අපේ පාසලට **කීර්තියක්** ලබා දුන් එම සිසුවියට මම සුබ **පතනවා.**"

**ශබ්ද විකාශන යන්ත්‍රයෙන්** විදුහල්පතිතුමා කියනු ඇසුණි. ඒ වෙලාවේ සඳලි හිටියේ පන්තිය අසල මල් පාත්තිය ළඟ. වරුණි, තාරකා, එරංගි සඳලි ළඟට දුවගෙන ආවා.

"සියලු දෙනා ම පිළිගන්න, මෙන්න අපේ ළමා නිවේදිකාව සඳලි වක්වැල්ල" එරංගි ශබ්ද නඟා කීවා.

"අපිට හරි ම ආඩම්බරයි සඳලි ඔයා ගැන" වරුණි කීවා.

ඔව්, අපිටත් සතුටුයි, නේද ජගත් ?

චතුර කීවේ ය.

"ආ . . . ඔන්න සිංහල ටීචර් එනවා. යමු, යමු පන්තියට"



“ආයුබෝවන් . . . ටීචර්”

“ආයුබෝවන් දරුවනේ. කෝ අපේ සඳලි ඉන්නවා ද?”

“මේ මෙතන ඉන්නේ ටීචර්”

“මට හරි ම සතුටුයි ඔයාගේ ජයග්‍රහණය ගැන. මම ඔයාට සුබ පතනවා, තව තවත් ඉදිරියට යන්න.”

“බොහෝ ම ස්තුතියි ටීචර්”

“ටීචර්, සඳලිට කටහඬ පරීක්ෂණයක් තියෙනවා ලු, ගුවන්විදුලි සංස්ථාවේ.”

“ආ . . . ඇත්ත ද ? ඔයාට හොඳ අවස්ථාවක් ලැබිලා තියෙන්නේ කවදා ද යන්නේ සඳලි ?”

ලබන බ්‍රහස්පතින්දා යන්න තියෙන්නේ ටීචර්.”

“සාහිත්‍ය උත්සවයත් එදාට නේ ද?”

“ඔව් ටීචර් . . . , එතකොට මගේ පිළිගැනීමේ කතාව?”

“ආ . . . ඒක කර ගන්න පුළුවන්. ඔයාට මේ ලැබුණු අවස්ථාව අපේ පාසලට ආඩම්බරයක්. ඔයා කටහඬ පරීක්ෂණයට යන්න.”

“හොඳයි ටීචර්”

“ඔයා හොඳ නිවේදිකාවක් වෙන්න. අපි සියලු දෙනා ම ඔයාට සුබ පතනවා.”

සඳලිගේ දෙනෙත් සතුටු කඳුළින් තෙත් විය.

## ක්‍රියාකාරකම 01

**පිළිතුරු කියන්න.**
*விடை சொல்லுங்கள்.*



i සුබ පැතුම නිවේදනය කළේ කවුද?

ii භාෂා තරගය තිබුණේ කොහේ ද?

iii සඳලි ජයගත් තරග මොනවා ද?

iv කටහඬ පරීක්ෂණය තියෙන්නේ කොහේ ද?

v සාහිත්‍ය උත්සවය තියෙන්නේ කවදා ද?

## ක්‍රියාකාරකම 02

**තෝරන්න. ලියන්න.**
*தெரிவு செய்யுங்கள். எழுதுங்கள்.*

| |
|---|
| **යනවා ලු, තියෙනවා ලු, කරනවා ලු, පැවැත්වෙනවා ලු, එදාට ලු** |

i කටහඬ පරීක්ෂණයක් .........................

ii සාහිත්‍ය උත්සවය .........................

iii එයා කොළඹ .........................

iv විදුහල්පති නිවේදනයක් .........................

v පිළිගැනීමේ කතාව .........................



## ක්‍රියාකාරකම 03

**සුදුසු අකුරු තෝරන්න. ලියන්න.**

பொருத்தமான எழுத்துக்களைத் தெரிவு செய்யுங்கள். எழுதுங்கள்.

| | | |
|---|---|---|
| i | ජයග්‍රහ..... | ණ, න |
| ii | සුබ පත.....වා | න, ණ |
| iii | පැවැත්වු..... | නා, ණා |
| iv | විකාශ..... | ණ, න |
| v | පරීක්ෂ.....ය | න, ණ |



## ක්‍රියාකාරකම 04

**පහත සඳහන් වචන යොදා ප්‍රශ්න අහන්න. ලියන්න.**

பின்வரும் சொற்களைப் பயன்படுத்தி வினாக்களைக் கேளுங்கள். எழுதுங்கள்.

උදාහරණය : ඉන්නවා ද?
සඳලි පන්තියේ ඉන්නවා ද?

i තියෙනවා ද? - ............................

ii යනවා ද? - ............................

iii කවදා ද? - ............................

iv ආවා ද? - ............................

v ලැබුණා ද? - ............................



## ක්‍රියාකාරකම 05

**"මා නිවේදන තරගයෙන් තේරී ඇත". දී ඇති අදහස් ඇසුරෙන් වාක්‍ය 5ක් ලියන්න.**

*''நான் அறிவிப்புப் போட்டியில் தெரிவுசெய்யப்பட்டுள்ளேன்''. வழங்கப்பட்டுள்ள கருத்துக்களைக் கொண்டு 5 வசனங்களை எழுதுங்கள்.*

i ගිය සුමානේ

..................................................................

ii අවස්ථාවක් ලැබුණා

..................................................................

iii මගේ පාසලට ආඩම්බරයක්


..................................................................

iv සුබ පැතුවා

..................................................................


v හොඳ නිවේදිකාවක්

..................................................................



# වචන මාලාව

| | | |
|---|---|---|
| කොළඹ දී | - | கொழும்பில் |
| සුබ පතනවා | - | வாழ்த்துத் தெரிவிக்கின்றேன் |
| කටහඬ පරීක්ෂණයක් | - | குரல் பரீட்சை/குரல் தேர்வு |
| තියෙනවා | - | இருக்கிறது |
| අපේ පාසලට | - | எமது பாடசாலைக்கு |
| ආඩම්බරයක් | - | ஒரு பெருமை |
| කටහඬ පරීක්ෂණයට | - | குரல் பரிட்சைக்கு / குரல் தேர்வுக்கு |
| කීර්තියක් | - | புகழொன்று |
| ශබ්ද විකාශන යන්ත්‍රයෙන් | - | ஒளிபெருக்கிச்சாதனம் மூலம் |
| ඉදිරියට යන්න | - | முன்னுக்குச் செல்லுங்கள் |
| සාහිත්‍ය උත්සවයක් | - | இலக்கிய விழாவொன்று |
| ඒක කර ගන්න පුළුවන් | - | அதனைச் செய்து கொள்ளமுடியும் |
| දෙනෙත් | - | இரு கண்கள் |
| සංස්ථාවේ | - | கூட்டுத்தாபனத்தில் |
| ජයග්‍රහණය | - | வெற்றி |
| සිසුවිය | - | மாணவி |
| නිවේදනය | - | அறிவித்தல் |



# 14 අයදුම් පතක් පුරවමු

දේවිකා ඉගෙන ගන්නේ මන්නාරම භාරතී මහා විද්‍යාලයේ ය. ඇයට සිංහල පාඨමාලාවක් සඳහා අයදුම් පතක් ලැබුණි. ඇය එය සම්පූර්ණ කර පංතියේ යාළුවන්ට දුන්නා ය.



01. සම්පූර්ණ නම :- ශිවරංජන් දේවිකා

02. මුලකුරු සමග නම :- එස්. දේවිකා

03. (අ) ලිපිනය :- "ශාන්ති",වවුනියාව පාර, මන්නාරම.

(ආ) පළාත :- උතුර

(ඇ) දිස්ත්‍රික්කය :- මන්නාරම

04. (අ) උපන් දිනය :- 2000. 04. 15

(ආ) 2015.05.20 දිනට වයස :- අවු. 15 මාස 01 දින 05

05. (අ) ස්ත්‍රී / පුරුෂ භාවය :- ස්ත්‍රී ☑ පුරුෂ ☐

06. (අ) දැනට ඉගෙන ගන්නා පාසල :- ම/භාරතී මහා විද්‍යාලය

(ආ) ඉගෙන ගන්නා ශ්‍රේණිය :- 10 වන ශ්‍රේණිය

07. (අ) භාරකරුගේ නම :- කන්දසාමි ශිවරංජන්

ඉහත තොරතුරු සත්‍ය බව ප්‍රකාශ කරමි.


| | |
|---|---|
| 2015.05.02 | ශිවරංජන් දේවිකා |
| දිනය | අත්සන |

## ක්‍රියාකාරකම 01

**අයදුම් පත පුරවන්න.**

*விண்ணப்பப் பத்திரத்தை நிரப்புங்கள்.*

### ක්‍රීඩා පුහුණුව සඳහා අයදුම් පත



01. සම්පූර්ණ නම :- ____________________

02. (අ) ලිපිනය :- ____________________

(ආ) පළාත :- ____________________

(ඇ) දිස්ත්‍රික්කය :- ____________________

03. (අ) උපන් දිනය :- ____________________

(ආ) 2020. 05. 10 දිනට වයස :-අවුරුදු ________ මාස ______ දින ______

04. (අ) ස්ත්‍රී / පුරුෂ භාවය :- ස්ත්‍රී ☐ පුරුෂ ☐

(ආ) පුහුණු වීමට කැමති ක්‍රීඩාව :- ______________

(ඇ) ඔබ ලබා ඇති ජයග්‍රහණ :-

කලාප ☐ පළාත් ☐ ජාතික ☐

ඉහත තොරතුරු සත්‍ය බව ප්‍රකාශ කරමි.

__________________ __________________

දිනය අත්සන

## ක්‍රියාකාරකම 02

**මෙම තොරතුරු කියවන්න. පහත අයදුම් පත පුරවන්න.**

இந்தத் தகவல்களை வாசியுங்கள். பின்வரும் விண்ணப்பப் பத்திரத்தை நிரப்புங்கள்.

උතුරු පළාතේ යාපනය දිස්ත්‍රික්කයේ, යාපනය පලාලි පාරේ අංක 03 දරන නිවසේ ශිවමූර්ති විජය කුමාර් පදිංචි ව සිටී. ඔහු ඉපදුණේ 1991. 05. 03 වන දිනයේ ය. ඉගෙන ගත්තේ යාපනය මහා විද්‍යාලයේ. 13 වන ශ්‍රේණිය දක්වා ඉගෙනුම ලැබුවේ ය.

**යාපනය මහා විද්‍යාලය ආදි ශිෂ්‍ය සංගමය**

**සාමාජික අයදුම් පත**

01. (අ) සම්පූර්ණ නම :- ____________________

02. (අ) ලිපිනය :- ____________________

(ආ) පළාත :- ____________________

(ඇ) දිස්ත්‍රික්කය :- ____________________

03. (අ) උපන් දිනය :- ____________________


(ආ) 2014. 07. 20 දිනට වයස :- අවුරුදු ________ මාස ________ දින ________

04. (අ) ස්ත්‍රී / පුරුෂ භාවය :- ස්ත්‍රී ☐ පුරුෂ ☐

(ආ) අවසන් වරට සමත් වූ ශ්‍රේණිය :- ____________

වර්ෂය :- ____________

ඉහත තොරතුරු සත්‍ය බව ප්‍රකාශ කරමි.



____________________ ____________________

දිනය අත්සන

## ක්‍රියාකාරකම 03

**ඔබගේ පාසල් පුස්තකාලයේ සාමාජිකත්වය ලබා ගැනීම සඳහා අයදුම් පතක් සකස් කරන්න.**

*உங்கள் பாடசாலை நூல் நிலையத்தில் அங்கத்துவத்தைப் பெறுவதற்காக விண்ணப்பப் பத்திரமொன்றைத் தயார் செய்யுங்கள்.*

**පාසල් ...................................... අයදුම් පත**

1. නම :- ..............................................
2. ලිපිනය :- ..............................................
3. උපන් දිනය :- ..............................................
4. ශ්‍රේණිය :- ..............................................
5. ස්ත්‍රී/ පුරුෂ භාවය :- ස්ත්‍රී ☐ පුරුෂ ☐
6. මව / පියා ගේ නම :- ..............................................

______________ දිනය      ______________ අත්සන




## ක්‍රියාකාරකම 04

**ඔබ පාසලේ වාර්ෂිකව පැවැත්වෙන චිත්‍ර තරගයට ඇතුළත් වීමට අයදුම් පතක් සකස් කරන්න.**

*உங்கள் பாடசாலையில் வருடாந்தம் நடாத்தப்படுகின்ற சித்திரப் போட்டியில் பங்குபற்றுவதற்கான விண்ணப்பப் படிவமொன்றைத் தயார் செய்யுங்கள்.*

**පාසලේ .................................. අයදුම් පත**



1. ........................... :- ..........................................
2. ........................... :- ..........................................
3. ........................... :- ..........................................
4. ........................... :- ..........................................
5. ........................... :- ස්ත්‍රී ☐ පුරුෂ ☐

______________ ______________

දිනය අත්සන

## ක්‍රියාකාරකම 05

**ඔබේ පාසලේ පරිසර නියමු වැඩසටහනට සාමාජිකයන් බඳවා ගැනීමට අයදුම් පතක් සකස් කරන්න.**

*உங்கள் பாடசாலையில் சுற்றாடல் வழிகாட்டி நிகழ்ச்சிக்கு அங்கத்தவர்களைச் சேர்த்துக் கொள்வதற்கான விண்ணப்பப் படிவமொன்றைத் தயார் செய்யுங்கள்.*



**පාසලේ ...................................... අයදුම් පත**

1. ............................ :- .........................................

2. ............................ :- .........................................

3. ............................ :- .........................................

4. ............................ :- .........................................

5. ............................ :- ස්ත්‍රී ☐ පුරුෂ ☐


________________ ________________

දිනය | අත්සන

# වචන මාලාව

| | | |
|---|---|---|
| සම්පූර්ණ නම | - | முழுப் பெயர் |
| මුලකුරු සමග නම | - | முதலெழுத்துக்களுடன் பெயர் |
| ලිපිනය | - | முகவரி |
| පළාත | - | மாகாணம் |
| දිස්ත්‍රික්කය | - | மாவட்டம் |
| උපන් දිනය | - | பிறந்த திகதி |
| ස්ත්‍රී / පුරුෂ භාවය | - | ஆண் / பெண் |
| දැනට ඉගෙන ගන්නා | - | தற்போது கல்வி கற்கின்ற |
| පාසල | - | பாடசாலை |
| දිනට වයස | - | தினத்திற்கு வயது |
| ඉගෙන ගන්නා ශ්‍රේණිය | - | கல்வி கற்கின்ற தரம் |
| භාරකරුගේ නම | - | பாதுகாவலரின் பெயர் |
| අත්සන | - | கையொப்பம் |
| දිනය | - | திகதி |

# 15 අපේ භාෂා කඳවුර



මෙවර භාෂා කඳවුර පැවැත්වෙන්නේ නුවරඑළිය මහා විද්‍යාලයේ දී ය. නුවරඑළිය **සුන්දර** කඳුකර ප්‍රදේශයකි. පරිසරය මීදුමින් වැසී ඇත. කඳු අතරින් **සීතල දිය ඇලි** ගලා බසියි. අපේ භාෂා කඳවුරේ අවසාන දවස අද යි. එය අපට අලුත් අද්දැකීමකි. පෙර දින පැවති සතුටු සිනා හඬ අද ඇසෙන්නේ නැත.



“අද අපි ගෙදර යනවා නේ ද?” ශිවා මා ළඟට පැමිණ ඇසුවේ ය.

මගේ ඇස්වලට කඳුළු නැගිණි.

“සයුරි, මොකද දුකින් වගේ?”

“සර්, අපි අද ගෙදර යනවානේ. මට දුක හිතුණා.

තව දවස් දෙකක්වත් කාලය දික් කරනවා නම් හොඳයි.

අපි ගොඩක් සතුටු වුණා. මේ කඳවුර නිසා දැන් දෙමළ ටිකක් පුළුවන්.

දැන් භාෂා දෙක ම කතා කරන්න පුළුවන්.

ඒ නිසා මම ගොඩක් යාළුවන් ආශ්‍රය කළා.”

සියලු දෙනා ම එතැනට එකතු වූහ.

කඳවුරේ කා අතරත් ජනප්‍රිය චරිතය වූ පද්මනාදන්, කතාවට එකතු විය.

“අපි සින්දු කිව්වා. නැටුවා. නාට්‍ය ඉදිරිපත් කළා.”

මම ගොඩක් සතුටු වුණා.

සිංහල ඉගෙන ගත්තා. සිංහල යාළුවන් හඳුනා ගත්තා.

භාෂාවක් ඉගෙන ගන්නකොට අනිත් අයගේ අගය දැනෙනවා.

වෙනත් භාෂා කතා කරන අය ආශ්‍රය කරන්න ඕන.

එහෙම වුණොත්, එයාලාගේ අදහස් දැනගන්න පුළුවන්.

මට තවත් ඉගෙන ගන්න ඕන කියලා හිතුණා.

“තව දින කිහිපයක් මේ කඳවුර තිබුණා නම් හොඳයි.” කියලා මටත් හිතෙනවා.

සියලු දෙනා ම හඬ නගා මේ ගීතය ගයන්නට විය.

සීත සුළං දසත හමන්නේ . . .
සුදු වලාකුළයි කන්දෙ හැපෙන්නේ . . .
නුවරඑළියෙ යන්න . . .
පොඩි විවේකයක් ගන්න . . .
ගතේ සිතේ සුවය දැනෙන්න . . .

අත්පොළසන් හඬ ද මුළු පරිසරය ම ගීතවත් කළේ ය.



## ක්‍රියාකාරකම 01

**පිළිතුරු ලියන්න.**

*விடை எழுதுங்கள்.*



i භාෂා කඳවුර පැවැත්වූයේ කොහේදී ද?

ii භාෂා කඳවුරේ ජනප්‍රිය චරිතය කවුද?

iii එම පරිසරයේ දැකිය හැකි දේවල් මොනවා ද?


iv මෙහි දැක්වෙන භාෂාවන් මොනවා ද?

v භාෂා කිහිපයක් දැන ගැනීම වැදගත් වන්නේ ඇයි?

## ක්‍රියාකාරකම 02

**වාක්‍ය සම්පූර්ණ කරන්න. කියවන්න.**

*வசனங்களைப் பூர்த்தி செய்யுங்கள். வாசியுங்கள்.*




i අපි ගොඩක් සතුටු වුණා. මට දෙමළ ..........................

ii දැන් භාෂා දෙක ම ..........................

iii වෙනත් භාෂා කතා කරන අය ..........................

iv එහෙම වුණොත්, එයාලාගේ අදහස් ..........................

v මට තවත් ඉගෙන ගන්න ..........................

## ක්‍රියාකාරකම 03

**උදාහරණය බලන්න. ලියන බසට හරවන්න.**

உதாரணத்தைப் பாருங்கள். எழுத்து மொழிக்கு மாற்றி எழுதுங்கள்.

**උදා : ගලා බසිනවා** **ගලා බසියි.**

i කතා කරන්න - .........................

ii සතුටු වෙනවා - .........................

iii ආශ්‍රය කරනවා - .........................

iv ඉදිරිපත් කරනවා - .........................

v අගය දැනෙනවා - .........................



## ක්‍රියාකාරකම 04

**ලියන බසට හරවා වාක්‍ය ලියන්න.**

எழுத்து மொழிக்கு மாற்றி - எழுதுங்கள்.

**උදා : දිය ඇලි ගලා බසිනවා** **දිය ඇලි ගලා බසියි.**

i පද්මනාදන් සිංහලෙන් කතා කරනවා.

ii ශිවා මා ළඟට එනවා.

iii මම සිංහල කතා කරනවා.

iv අපි ගොඩක් සතුටු වුණා.


v සියලු දෙනා අත්පොළසන් දුන්නා.



## ක්‍රියාකාරකම 05

**ඔබ කැමති මාතෘකාවක් තෝරාගෙන සරල වාක්‍ය 05ක් ලියන්න.**

*உங்களுக்கு விருப்பமான ஒரு தலைப்பைத் தெரிவு செய்து இலகு வசனங்கள் 5ஐ எழுதுங்கள்.*



**i** මා දුටු නුවරඑළිය.

- i ලස්සන කඳු පිහිටා ඇත.
- ii ලස්සන මල්වතුවලින් පිරී ඇත.
- iii ..........................................................................
- iv ..........................................................................
- v ..........................................................................

**ii** මා දුටු ලස්සන ම දිය ඇල්ල.


- i මා දුටු ලස්සන ම දිය ඇල්ල ඩෙවෝන් ය.
- ii එය නුවරඑළිය දිස්ත්‍රික්කයේ පිහිටා තිබේ.
- iii ..........................................................................
- iv ..........................................................................
- v ..........................................................................

**iii** භාෂාවක් ඉගෙනීමේ වැදගත්කම.


- i වෙනත් භාෂා කතා කරන මිතුරන් ආශ්‍රය කරන්න පුළුවන් වීම.
- ii ඔවුන්ගේ අදහස් දැන ගැනීමට හැකි වීම.
- iii ..........................................................................
- iv ..........................................................................
- v ..........................................................................

# වචන මාලාව

| | | |
|---|---|---|
| සුන්දර | - | அழகான |
| සීතල | - | குளிர் |
| දිය ඇලි | - | நீர் வீழ்ச்சிகள் |
| මගේ | - | எனது |
| දෙක ම කතා කරන්න පුළුවන් | - | இரண்டையும் கதைக்க முடியும் |
| යාළුවන් ආශ්‍රය කළා | - | நண்பர்களுடன் பழகினோம் |
| සතුටු වුණා | - | சந்தோஷமடைந்தார்கள் |
| ආශ්‍රය කරන්න ඕන | - | பழக வேண்டும் |
| දැනගන්න පුළුවන් | - | அறிந்து கொள்ள முடியும் |




# 16 මල්ලී අකුරු කියවන්නේ අද



අද හොඳ දවසක්. අපේ චූටි මල්ලිට **අකුරු කියවන්නේ** අදයි. අම්මා **කිරිබත් උයනවා.** අපි හැමෝ ම උඩහ ගෙදර මාමාගේ වෑන් එකෙන් කන්දෙ පන්සලට යන්නේ. මල්ලීට කන්දෙ පන්සලේ **ලොකු හාමුදුරුවෝ** යි අකුරු කියවන්නේ.

උදේ පහට පමණ අපි පන්සල් යන්න පිටත් වුණා. පුංචි අපිට නම් අද හරිම සතුටු යි. ටික දුරක් යද්දී ලොකු අක්කා සින්දුවක් කියන්න පටන් ගත්තා ය.



අයන්න කියන්න ලොවට ම ඇහෙන්න
එන්න මගේ මල්ලී . . .
දුවන්න පනින්න නටන්න ගයන්න
එන්න මගේ නංගී . . .
එන්න මගේ මල්ලී . . . එන්න මගේ නංගී. . .

**මල්ලියි මමයි** ගායනයට එක් වුණෙමු.

උදේ හයහමාරට පමණ අපි කන්දෙ පන්සලට ළඟා වුණෙමු. "පුතාලා පන්සලේ දී නිශ්ශබ්දව ඉන්න ඕන. එහේ මෙහේ දුවන්න එපා." තාත්තා කීවේ ය. අපි සියලු දෙනා ම කිරිබත්, කැවුම්, කොකිස්, කෙසෙල් ගෙඩි අරගෙන දාන ශාලාවට ගියෙමු.



"මේ භාජන ටික **සෝදන්න. බුද්ධ පූජාව බෙදන්න.**" අම්මා නංගීට කීවා ය.

"පුතේ **හාමුදුරුවන්ට හීල් දානේ** සූදානම් කරන්නේ **මෙතැන.** හාමුදුරුවරු **කී** නමක් **වඩිනවා ද?**" උඩහ ගෙදර නැන්දා ඇසුවා ය. හාමුදුරුවරු පස් නමයි. අන්න එක නමක් වඩිනවා. ඒ නායක හාමුදුරුවො. අවසරයි හාමුදුරුවනේ. **මෙතනින් වැඩ ඉන්න.** පුතා දානේ පිළිගන්වන්න. මුලින් ම පැන් **පිළිගන්වන්න.** එන්න හැමෝ ම දානේ බෙදන්න. තාත්තා කීවේ ය. හාමුදුරුවරු දානේ වැළඳූහ. දායක මහත්තයෝ දැන් නැකත් වෙලාවත් ළඟයි නේ ද? එහෙමයි හාමුදුරුවනේ, උදේ 7.35 ට. එහෙනම් අපි ධර්ම ශාලාවට අකුරු කියවන්න යමු. එහෙමයි හාමුදුරුවනේ. එන්න පුතේ, අපි යමු අකුරු කියවන්න.

## ක්‍රියාකාරකම 01

**පිළිතුරු ලියන්න.**

*விடை எழுதுங்கள்.*



i පන්සලට යන්නේ කුමකට ද?

ii මේ අය ගියේ කොහේට ද?

iii පාඩමේ සඳහන් කෑම වර්ග මොනවා ද?

iv පන්සලේ දී හැසිරිය යුත්තේ කෙසේ ද?

v මල්ලීට අකුරු කියවන්නේ කවුද?

## ක්‍රියාකාරකම 02

**පිළිතුරු තෝරන්න. ලියන්න.**

விடைகளைத் தெரிவு செய்யுங்கள். எழுதுங்கள்.

i අම්මා උදේට හැදුවේ මොනවා ද?
(i. **කැවුම්** ii. **ඉඳිආප්ප** iii. **කිරිබත්**)

ii මල්ලීට අකුරු කියවන්නේ කොහේ දී ද?
(i. **ගෙදර දී** ii. **පාසලේ දී** iii. **පන්සලේ දී**)

iii කන්දේ පන්සලට යාමට පිටත් වුණේ කීයට ද?
(i. **උදේ හතට** ii. **උදේ පහට** iii.**උදේ හයහමාරට**)



iv පන්සලට ළඟා වුණේ කීයට ද?
(i. **උදේ පහට** ii. **උදේ හතයි තිස් පහට**
iii.**උදේ හයහමාරට**)

v දානය සූදානම් කළේ හාමුදුරු කී නමකට ද?
(i. **දෙනමකට** ii. **තුන් නමකට** iii. **පස් නමකට**)

## ක්‍රියාකාරකම 03

**භික්ෂූන් වහන්සේලා සඳහා භාවිත වචන පාඩමෙන් තෝරා ලියන්න.**

பிக்குமார்களுக்காக உபயோகிக்கப்படும் சொற்களைப் பாடத்திலிருந்து தெரிந்தெடுத்து எழுதுங்கள்.

**උදාහරණ :** කෑම දානේ

i වතුර - ..........................................

ii උදේ ආහාරය - ..............................

iii එනවා - ..............................

iv ඉඳගන්නවා - ..............................

v දෙනවා - ..............................

vi කනවා - ..............................



## ක්‍රියාකාරකම 04

**පාඩමේ ඇතුළත් පන්සලේ දී ලැබුණු උපදෙස් ලියන්න. කියන්න.**

*பாடத்திலுள்ள விகாரையிலிருந்து கிடைத்த அறிவுரைகளை எழுதுங்கள். வாசியுங்கள்.*

i ..............................................................................................................

ii ..............................................................................................................

iii ..............................................................................................................

iv ..............................................................................................................

v ..............................................................................................................

## ක්‍රියාකාරකම 05

**පහත සඳහන් මාතෘකාවලින් ඔබ කැමති එක් අවස්ථාවක් ගැන වාක්‍ය 10ක් ලියන්න.**

*பின்வரும் தலைப்புக்களில் உங்களுக்கு விருப்பமான ஒரு சந்தர்ப்பம் பற்றி 10 வசனங்களை எழுதுங்கள்.*



i මා පාසල් ගිය මුල් ම දවස.

ii නංගී මුලින් ම අකුරු කියවූ දා.

iii මා පන්තියේ පළවැනියා වූ දවස.

iv මා ගිය විනෝද ගමනක්.

i ..........................................................................................

ii ..........................................................................................

iii ..........................................................................................

iv ..........................................................................................

v ..........................................................................................

vi ..........................................................................................

vii ..........................................................................................

viii ..........................................................................................

ix ..........................................................................................

x ..........................................................................................

# වචන මාලාව

අකුරු කියවන්නේ - எழுத்துக்கள் வாசிப்பது

කිරිබත් උයනවා - பாற்சோறு சமைக்கிறார்

තාත්තා - தந்தை

ලොකු හාමුදුරුවෝ - பெரிய ஹாமுதுறு

සෝදන්න - கழுவுங்கள்

පූජාව බෙදන්න - பூசையைப் பரிமாறுங்கள்

වඩිනවා ද? - சமூகம் தருவீர்களா?

මෙතනින් වැඩ ඉන්න - இங்கு அமருங்கள்

පිළිගන්වන්න - பகிருங்கள்


මල්ලියි මමයි - தம்பியும் நானும்

හාමුදුරුවන්ට - ஹாமுதுறுவுக்கு

හීල් දානේ - காலை உணவு

මෙතැන - இங்கு/ இவ்விடத்தில்






තනුව : විශාරද එඩ්වඩ් ජයකොඩි